මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
MINISTRY OF FINANCE AND MASS MEDIA

# 2016 වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT




සැලසිනෙ
செலசினெ
SELACINE
SELACINE TELEVISION INSTITUTE

ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
කොළඹ 05.

ගරු අමාත්‍යතුමනි,

**<u>වාර්ෂික වාර්තාව - 2016</u>**

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2016 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.



උමා රාජමන්ත්‍රී
සභාපතිනිය
සැලසිනෙ රූපවාහිනී ආයතනය
කොළඹ 07.

# පෙළ ගැස්ම


| | |
|---|---|
| දැක්ම, මෙහෙවර, අරමුණු | 05 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 07 |
| ආයතනික තොරතුරු | 08 |
| පරිපාලන ව්‍යුහය 2016 හා සම්බන්ධ තොරතුරු | 10 |
| මූල්‍ය වාර්තා - 2016 | 15 |
| මූල්‍ය වාර්තා සඳහා සටහන් | 18 |
| ආදායම් ප්‍රකාශය | 21 |
| ශේෂ පත්‍රය | 22 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 23 |
| මූල්‍ය වාර්තා සඳහා සටහන් | 25 |
| 2016 වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ විගණකාධිපතිතුමාගේ මතය | 34 |
| 2016 වර්ෂයේ විගණකාධිපතිතුමාගේ වාර්තාව සඳහා පිළිතුරු | 47 |

# දැක්ම

රාජ්‍ය යාන්ත්‍රණයේ සංවර්ධන හා මෙහෙයුම් සහ සියලු ව්‍යාපාර ක්ෂේත්‍රයන්හි ප්‍රවර්ධනයන් නිර්මාණාත්මකව සන්නිවේදනය කිරීම තුළින් ප්‍රචාරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීම.

# මෙහෙවර

නිපුණත්වයෙන් හෙබි වඩාත් නිර්මාණශීලී හා දිරිමත් පුද්ගල සහය භාවිතා කරමින් උපක්‍රමශීලිත්ව මෙන්ම උසස් තලයේ තාක්ෂණය ද නිර්මාණාත්මකව උපයෝගී කරගනිමින් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා සන්නිවේදන සහ වෙනත් නිර්මාණශීලී ප්‍රචාරාත්මක අනගි සේවාවක් සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය සහ දේශපාලන සංවර්ධනය සඳහා සක්‍රීයව දායක වීම.

# අරමුණ

මූල්‍ය තත්ත්වය ඉහළ දැමීම.
වෙළෙඳපොල ලාභය ඉහළ දැමීම.
සේවාලාභී සංස්කෘතිය ඉහළ දැමීම සඳහා වූ උපක්‍රම ක්‍රියාත්මක කිරීම.
ආයතන සේවකයින් සහ නායකයින් වර්ධනය කිරීම.

# සභාපතිතුමියගේ සමාලෝචනය



මා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ සභාපති ධූරයට පත්වීමෙන් අනතුරුව ආයතනය විසින් එළිදක්වනු ලබන 2016 වාර්ෂික වාර්තාවට පණිවුඩයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් සතුටු වෙමි.

පසුගිය වර්ෂ 34 ක කාලය දෙස ආපසු හැරී බැලීමේ දී ආයතනය විසින් අත්පත් කරගෙන ඇති ජයග්‍රහණ රාශියකි. තවද ආයතනයේ මූල්‍ය හා පරිපාලන අංශවල සැලකිය යුතු වර්ධනයක් ඇති කරගැනීම විශේෂත්වයකි.

2016 වර්ෂයේ දී රු.මි.397.6 ක අලෙවි ආදායමක් ලබාගැනීමට හැකි වූ අතර, මෙය 2015 වර්ෂය හා සැසඳීමේ දී රු.මි.130.0 ක වර්ධනයක් අත්පත් කරගැනීමට අප ආයතනයට හැකි වීම සතුටට කරුණකි.

සැලසිනෙ ආයතනයේ ගිණුම් කටයුතුවල නිර්වද්‍යභාවය පිළිබඳව ගිණුම් වාර්තාවන්ට අනුකූලව පිළියෙල කිරීම සම්බන්ධයෙන් ආයතනය විසින් සාර්ථක වූ අවස්ථා කිහිපයක් පසුගිය මූල්‍ය ප්‍රකාශනයන්ගෙන් හෙළිදරව් විය. වර්ෂ 2011, 2012, 2015 සහ 2016 වර්ෂයන් වෙනුවෙන් විගණකාධිපතිගේ මතය යහපත් ලෙස සනිටුහන් කිරීම එයට කදිම නිදසුනකි. මෙම තත්ත්වය ඉදිරියටත් පවත්වාගෙන යෑම සඳහා මූල්‍ය අංශය විසින් කැපවී කටයුතු කිරීම සිදු කරනු ලබයි.

පරිපාලන අංශය විසින් මානව සම්පත් සංවර්ධනයට අදාළව කළ යුතු වැඩි දියුණු කිරීම් පිළිබඳව නිරතුරුව සොයා බලා කටයුතු කරයි. සේවකයින් හට පුහුණු අවස්ථාවන් ලබාදීම, ඔවුන්ගේ දුෂ්කරතාවයන් සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම, වෛද්‍ය රක්ෂණ ප්‍රතිලාභ ලබාදීම, විනෝද චාරිකා සඳහා පහසුකම් සපයාදීම සහ ආයතනයේ සුභසාධනය මගින් රටේ පවත්නා කාළගුණ විපර්යාසයන් වලදී ආයතනයේ සේවක සේවිකාවන් විසින් රටවැසියන් හට විශේෂ උදව් ලබාදීම් වැනි ප්‍රජාසත්කාරක කටයුතු ද දියත් කරනු ලැබීම මගින් ආයතනයේ මානව සම්පත් සංවර්ධනය ඇති කිරීමට අවශ්‍ය පසුබිම සකස් කර තිබේ.

ලේක්හවුස් ආයතනය සමඟ ඇති සහයෝගී සම්බන්ධතාව වර්ධනය වූ අතර, දැන්වීම් ලබාදෙන ආයතන අතරින් ප්‍රථම ස්ථානය ලබාගැනීමට හැකි වීම සුවිශාල ජයග්‍රහණයකි. ඒ සඳහා ග්‍රැෆික් නිර්මාණ අංශය සුදුසු දැන්වීම් නිර්මාණය කිරීමත්, මාධ්‍ය අංශය විසින් එය උපලේඛනගත කිරීමේ දී දැක්වූ දක්ෂතා ද හේතුවිය. 2016 වර්ෂයේ දී ඉතා දුෂ්කර තත්ත්වයන් මාධ්‍යයේ අලෙවි අංශය විසින් අලෙවි කටයුතු නංවාලීම සම්බන්ධයෙන් අවශ්‍ය ප්‍රයත්නයන් දැරීමට ද වැඩි අවධානයක් යොමු කරන ලදී. අලෙවි අංශය විසින් ඉසව් කටයුතු වල දී සහයෝගයෙන් ක්‍රියාකිරීම අගය කළ යුතු වේ.

නිෂ්පාදන අංශය විසින් ආයතනයේ ප්‍රතිරූපය නංවාලීමට අවශ්‍ය පසුබිම ගොඩනැගීමට "සුවපත් කරන්නන්ගේ පාරාදීසය" වැනි ආකර්ශනීය වාර්තා වැඩසටහන්, ගව පාලනය පිළිබඳ කෘෂිකාර්මික වාර්තා වැඩසටහන් හා මහජනයා දැනුවත් කිරීමේ විද්‍යුත් මාධ්‍ය දැන්වීම් ප්‍රචාරණයට දායක වීම සිදු කරන ලදී.

ආයතනය විසින් අලුතෙන් ස්ථාපනය කරන ලද ඉසව් කළමනාකරණ අංශය විසින් ආදායම් උත්පාදනය සඳහා දායක වීම අගය කළ යුතුය. එහිදී අයිවෝ ඩෙනිස් කලාශූරීන්ගේ කුරුළු පාරාදීසය, ජාතික මහා ක්‍රීඩා උලෙළ සහ සංචාරක දිනය වැනි ප්‍රධාන ඉසව් කටයුතු ඉටු කිරීම මෙම සුවිශේෂී කාර්යයන් අතරින් කිහිපයක් බව සඳහන් කළ යුතුවේ.

ආයතනය විසින් අලුතෙන් ස්ථාපනය කරන ලද තවත් අංශයක් වන්නේ තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති අංශයයි. මෙමගින් ආයතනයේ ප්‍රතිරූපය ගොඩනැංවීමට අවශ්‍ය මූලික කාර්යයන් ආරම්භ කරන ලදී. සැලසිනෙ ආයතනයේ වෙබ් අඩවිය සැකසීම, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් තොරතුරු තාක්ෂණ ප්‍රචාරණය, වෙබ් සැකිසීම හා සංවර්ධනය වැනි කාර්යයන් සිදු කරන ලදී.

සමස්ථ ආර්ථික රටාවට උචිත අයුරින් රජයට අයත් එකම ප්‍රචාරණ ආයතනය ලෙස අප වෙත පැවරෙන වගකීම පුළුල්වීම නොවැලැක්විය හැක. එවැනි අභියෝගයන්ට මුහුණදෙමින්, අභියෝගාත්මක මෙහෙවරක් සඳහා පෙලගැසීම මෙම යුගයේ කාර්භාරය වනු ඇත.



උමා රාජමන්ත්‍රී
සභාපතිනිය
සැලසිනෙ රූපවාහිහිනී ආයතනය

# ආයතනික තොරතුරු

### නාමය

සැලසිනෙ රූපවාහිනී ආයතනය

### නීතිමය ස්වරූපය හා අතීත කාර්ය ස්වභාවය

- 1982 පෙබරවාරි 01 දින සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ අධිකාරිත්වය යටතේ ආරම්භ විය.
- 1982 සිට 1989 දක්වා ඉඩම්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය දැව සංස්ථාවේ මානව හා මූල්‍ය සම්පත් යටතේ මහවැලි කඩිනම් සංවර්ධන වැඩසටහන පිළිබඳ ශ්‍රී ලාංකීය ජනතාව දැනුවත් කිරීමේ කාර්යය සිදුකිරීම.
- 1989 ජනසවිය වැඩසටහනේ ප්‍රචාරාත්මක කාර්යභාරය සිදුකිරීම
- 1989.08.19 දිනැති අංක 832/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් සැලසිනෙ ආයතනය යෞවන කටයුතු, ක්‍රීඩා හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතට පවරන ලදී. (මෙය ආයතනය සම්බන්ධව ගැසට් නිවිදනයක් මගින් කරනු ලැබූ පළමු පැවරීමයි)
- 1997.06.09 දිනැති අංක 979/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් තැපැල්, විදුලි සංදේශ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2001.12.20 දිනැති 1215/14 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනසන්නිවේදන අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2004.04.28 දිනැති 1338/9 දරන අති විශේෂ ගැසට් නිවේදනය තුළින් තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස නම් කරනු ලැබීය.
- 2005/12/08 දිනැති 1422/22 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස ස්ථාපිත කරනු ලැබීය.
- 2007 අංක 07 දරන සමාගම් පනතෙහි විධිවිධානයන්ට අනුව පූර්ණ අයිතිය රජයට හිමි පොදු සමාගමක් බවට පත්කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත 2008. 03. 26 දිනැති සන්දේශය ඉදිරිපත් කෙරුණි.

## ආයතනික කාර්ය භාරය

- රජයේ මාධ්‍ය ප්‍රචාරණ හා නිෂ්පාදන ආයතනය ලෙස ක්‍රියාත්මක වීම.

- 2005. 05. 16 දින අංක 1380/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් පහත සඳහන් කරුණු කාර්ය විෂය පථයට ඇතුළත් කෙරුණි.

  i. මුද්‍රිත / විද්‍යුත් මාධ්‍ය දැන්වීම් නිෂ්පාදනය

  ii. රජයේ සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරක කටයුතු

  iii. රජයේ ප්‍රචාරක වැඩසටහන් නිෂ්පාදනය

- 2008. 12. 02 දිනැති ජනමාධ්‍ය හා තොරතුරු ගරු අමාත්‍යතුමාගේ සංදේශය සම්බන්ධ නිරීක්ෂණයෙන් අනතුරුව 2008. 12. 24 දිනැති අංක 08/2253/338/043 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් සියලුම අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති ආයතනවල සියලුම වෙළෙඳ දැන්වීම් හා ප්‍රචාරාත්මක වැඩසටහන් සැලසිනෙ රූපවාහිනී ආයතනය මගින් ඉටුකරවා ගැනීම අනිවාර්ය කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

- රූපවාහිනී වාර්තාමය වැඩසටහන්, ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම රූපවාහිනී හා ගුවන් විදුලි වෙළෙඳ දැන්වීම් යනාදී ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයන් නිෂ්පාදනය කිරීම

- විවිධ වූ පුවත්පත් දැන්වීම් නිර්මාණය මෙන්ම එම දැන්වීම් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හි උපලේඛනගත කිරීම.

- ඉසව් කළමනාකරණය හා මුද්‍රණ කටයුතු.

# පරිපාලන ව්‍යුහය - 2016

### ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය

| | | |
|---|---|---|
| තුසිත ජයවර්ධන | - | සභාපති |
| සනත් ධර්මරත්න | - | සාමාන්‍යාධිකාරී |

### කළමනාකරණය

| | | |
|---|---|---|
| ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න | - | කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) |
| අතුල අන්ද්‍රාදි | - | කළමනාකරු (නිෂ්පාදන) |
| අග්බෝ අමරසේකර | - | පාරිභෝගික සේවා අධ්‍යක්ෂ |
| නලීන් අලහකෝන් | - | කළමනාකරු (මාධ්‍ය) |
| ශාන්ත ලොකුකැටගොඩ | - | කළමනාකරු (මූල්‍ය) |
| සුජිත් පුෂ්පකුමාර | - | කළමනාකරු (ග්‍රැෆික්) |

### විගණක

රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව

### බැංකුකරුවන්

ලංකා බැංකුව

### සම්බන්ධීකරණ තොරතුරු

| | | |
|---|---|---|
| **ලිපිනය** | - | අංක : 224, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 |
| **දුරකථනය** | - | 011-4320777, 011-4061586 |
| **ෆැක්ස්** | - | 011-2058229 |
| **විද්‍යුත් තැපෑල** | - | selacine@gmail.com |
| **වෙබ් අඩවිය** | - | www.selacine.lk |

# නිර්මාණ සහ ග්‍රැෆික් අංශය

සැලසිනේ ආයතනයේ කාර්යශූර හා නිර්මාණශීලී තවත් අංශයක් ලෙස නිර්මාණ හා ග්‍රැෆික් අංශය හඳුන්වාදිය හැකිය. මෙම අංශයෙහි පළපුරුදු වෘත්තීය ග්‍රැෆික් නිර්මාණ ශිල්පීන් ඕනෑම නිර්මාණශීලී කටයුත්තක් සඳහා නිරතුරු සූදානමින් සිටියි. ඔවුන් පැය අටක කාල රාමුවක් තුළට කොටු නොවී ග්‍රැෆික් නිර්මාණකරණයේ නව තාක්ෂණික දැනුමෙන් නිරන්තර යාවත්කාලීන වෙමින් තමන් හට පැවරුණු කාර්යයන් නිසි වගකීමෙන් යුතුව කැපවී ඉටු කරයි.

පුවත්පත් දැන්වීම් නිර්මාණකරණය, ත්‍රිමාණකරණය, ත්‍රිමාණ සජීවීකරණය මෙන්ම පෝස්ටර් සහ බැනර් ආදී ප්‍රකාශනයන්හි මූලික කේන්ද්‍රස්ථානය වනුයේද මෙම අංශයයි. අප අංශය සතු නිර්මාණශීලීත්වය මෙන්ම කලට වේලාවට වැඩ නිම කර දීමේ ගුණයද අප හට පාරිභෝගිකයින්ගෙන් හිමි වන නොමඳ ප්‍රශංසා ආදියට හේතු වෙයි.

ලේක් හවුස් ආයතනය වෙත ලැබෙන දෛනික පුවත්පත් දැන්වීම් අතුරින් වැඩිම පුවත්පත් දැන්වීම් ප්‍රමාණයක් ලැබෙනුයේ අපගේ සැලසිනේ ආයතනයටයි. එම දැන්වීම් නිර්මාණය කිරීමේ භාරදූර වගකීම සෑපුවම නිර්මාණ හා ග්‍රැෆික් අංශය වෙත පැවරෙයි. එම වගකීම නොපිරිහෙලා ඉටුකරමින් උසස් තාක්ෂණික දැනුම භාවිතයෙන් ගුණාත්මකව මෙන්ම නිරවද්‍යතාවයෙන් යුතුව නිර්මාණය වන දැන්වීම් ගොන්න ආයතනයේ කීර්ති නාමය වෙතටද ගෙන එන්නේ ආලෝකයකි.

වසර ගණනාවක් පුරා මෙලෙස සිදුවන ක්‍රියාවලිය තුළ අන් වසර වල මෙන්ම 2017 වසරේදී ද ගුණාත්මකබව සහ කාර්යක්ෂමතාව දිනෙන් දින වැඩි කරගනිමින් සැලසිනේ නිර්මාණ හා ග්‍රැෆික් අංශය ඉදිරියටම පියනගමින් සිටියි.

# මාධ්‍ය අංශය

මාධ්‍ය අංශයේ ප්‍රමුඛ කාර්යභාරය වන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හි දැන්වීම් සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ උපලේඛනගත කිරීම්ය. එය සෑම වර්ෂකයම වැඩිම ආදායම් උපදවන්නේ මාධ්‍ය අංශයේ උපලේඛනගත කිරීම් තුලිනි. ඒ අනුව 2016 වර්ෂයේද වඩාත් කාර්යක්‍ෂමව සිදුකරන ලදී. මෙහිදී සමස්ත ආයෝජනය රු. මිලියන 314 කි.

2016 වර්ෂයේද ලේක්හවුස් පුවත්පත් ආයතනය වෙත වැඩිම දැන්වීම් ප්‍රමාණයක් ලබා දෙන ලදී.

2016 වර්ෂය තුලදී වෘත්තීය පුහුණු අමාත්‍යාංශය සහ ලංකා විදුලි බල මංඩලය වෙත කරන ලද දැන්වීම් ආයෝජනය රු. 62 කි. ඉහත ආයතන වෙත බලාපොරොත්තු වූ ඉලක්කයන් කරා නිවැරදිව යාමට මෙයින් හැකිවිය.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙලේ දැන්වීම් ප්‍රචාරන නියෝජිත ආයතනයක් ලෙස අපගේ නිර්මාණ කාර්යයන් පමණක් නොව ප්‍රචාරණයේ ඉහල මට්ටමේ හැකියාවන් සැලසිනෙ සතුබව මෙයින් පෙන්නුම් කෙරේ.

# අලෙවි හා පාරිභෝගික සේවා අංශය

2016 මුදල් වර්ෂය අප ආයතනයෙහි වෙළඳ අංශයෙහි කැපී පෙනුන වර්ධනයක් පෙන්නුම් කළ වර්ෂයක් විය. මූල්‍යමය වශයෙන් මිලියන 397 ක ඉලක්කගත ආදායමක් අප උපයා ගත් අතර එය පසුගිය වර්ෂය හා සසඳා බැලීමේදී කැපී පෙනෙන වර්ධනයක් ලං කරගත් වර්ෂයක් බව අවධාරණය කරමු.

වෙළඳ අංශයට අනුයුක්තව උත්සව කළමනාකරණය සඳහා පිහිට වූ අංශය මගින් සුවිශේෂී දායකත්වයක් මෙම වසර තුළදී ලබා ගැනීමට හැකි වීම විශේෂත්වයකි.

# මානව සම්පත් හා පරිපාලන අංශය

ආයතනයක පවතින මූලිකම සම්පත මානව සම්පතයි. වඩා ඵලදායිතාවයෙන් යුත් සේවාවක් මානව සම්පත තුලින් ආයතනය වෙත අත්කරගැනීම පිණිස ලබාදෙන ලද දායකත්වය පහත පරිදි වේ.

- 2016 වර්ෂයේ දී කාර්ය මණ්ඩලයේ පුහුණුව හා සංවර්ධනය වැඩිදියුණු කිරීමේ අරමුණින් විවිධ අධ්‍යාපන ආයතන තුලින් දියත් කරන ලද පුහුණු වැඩමුළු සඳහා සේවකයින් යොමු කිරීම හා ඊට අදාල මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදීම සිදුකරන ලදි. එසේම කාර්ය මණ්ඩලයේ වෘත්තීය අධ්‍යාපනය සංවර්ධනය කිරීමෙහි ලා අධ්‍යාපන පාඨමාලාවන් වෙනුවෙන් ආයතනික මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදී ඇත.
- ආයතනයේ කාර්ය මණ්ඩලයේ සුබසාධක වෙනුවෙන් ඉහල ප්‍රතිලාභ වලින් යුත් සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් ලබාදීම, සේවක ණය ලබාදීම, උත්සව අත්තිකාරම්, ප්‍රසාද දීමනා ලබාදීම සිදුකරන ලදි.
- කාර්ය මණ්ඩලයේ සුහදතාවය වර්ධනය කිරීම, රාජකාරි සඳහා වන කැපවීම උනන්දුව ඇති කිරීම, සේවක අභිප්‍රේරණය, අභියෝගයට ලක්කිරීම සහ පෞද්ගලිකව එක් එක් සේවකයාගේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් වයඹ පුහුණු ආයතනයේදී තෙදින අභිප්‍රේරණ වැඩමුළුවක් දියත් කිරීම.
- සේවක දිරිගැන්වීමේ ක්‍රමයක් වශයෙන් පැමිණීමේ දිරි දීමනාව තවදුරටත් ක්‍රියාත්මක කිරීම
- කාර්යක්ෂම සේවාවක් ලබාගැනීම සඳහා කාර්ය මණ්ඩලයේ ඉල්ලීම පරිදි ඔවුන්ට අවශ්‍ය කාර්යාලීය උපකරණ කඩිනමින් ලබාදීමට කටයුතු කිරීම

# නිෂ්පාදන අංශය

සැලසිනෙ හැඩකරන මාහැඟි අභරණය එහි නිෂ්පාදන අංශයයි. දිනෙන් දින එම අභරණය තව තවත් ඔප දමමින් හැඩ වන්නේ එයට අලුතින් ඇමිණෙන අලංකාර මිණි කැට නිසායි. 2016 වසරේදී ද අන් වසර වල මෙන්ම වටිනා මිණි කැට රැසක් මෙම පළඳනාවට අලුතින් එකතු විය.එම මිණි කැට අනෙකක් නොව නිෂ්පාදන අංශයේ ශිල්පීන්ගේ කුසලතා, කැපවීම්, එකමුතුකම, සහෝදරත්වය තුළින් බිහිවන අගනා නිර්මාණයන්ය.

ඌව පළාත් සභාව වෙනුවෙන් එහි සංචාරක ආකර්ෂණය විදහාපෑම සඳහා පාරිසරික අසිරිය පෙන්වන ස්ථාන ඇසුරින් නිෂ්පාදිත පාරිසරික වාර්තා වැඩසටහන් මාලාව, සත්ත්ව නිෂ්පාදන පිළිබඳ ගොවීන් දිරිමත් කිරීමේ අරමුණෙන් නිපදවූ වාර්තා වැඩසටහන, අපගේ ආයුර්වේදය හා ආයුර්වේද ක්‍රමශිල්ප ජාත්‍යන්තරයට හඳුන්වාදීමේ අරමුණෙන් ඉංග්‍රීසි බසින් නිෂ්පාදිත ආයුර්වේදය පිළිබඳ වාර්තා වැඩසටහන, ළමුන් හා කාන්තාවන්ගේ නොදැනුවත් භාවය හේතුවෙන් ඔවුන් අපයෝජනයට පත්වීම වැළැක්වීම සඳහා ඔවුන් දැනුවත් කිරීමේ අරමුණෙන් ළමා හා කාන්තා කාර්යංශය වෙනුවෙන් නිපදවන ලද දියණි කෙටි චිත්‍රපටය, උසස් අධ්‍යාපන වරම් අහිමිවීම හේතුවෙන් පාසැල් හැරගිය තරුණ ප්‍රජාවට නිසි මග පෙන්වීම උදෙසා නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යංශය වෙනුවෙන් නිපදවන ලද වෙළඳ දැන්වීම් කිහිපය, විදුලි බල මණ්ඩලයෙහි තාක්ෂණික ක්‍රියාවලිය පිළිබඳ යම් අවබෝධයක් දීම උදෙසා ලංකා විදුලිබල මණ්ඩලය වෙනුවෙන් නිපදවන ලද වාර්තා වැඩසටහන ආදිය කැපී පෙනෙන නිර්මාණ වේ. මිණි පළඳනාවේ 2016 වසරේදී වඩාත් ඔප දුන් මිණි කැට මේවායි.

වසරින් වසර නිර්මාණකරණයෙහි හිණි පෙත්තට ළඟා වන සැලසිනේ නිර්මාණ අංශය නිර්මාණාත්මක මුහුණුවරකින් යුත් හරවත් නිර්මාණ රැසක් ප්‍රේක්ෂක මනදොල සනහනු වස් නිරන්තරයෙන් බිහි කරයි. ඒවා ප්‍රේක්ෂක මතකයෙහි සැමවිට රැඳී පැවතීමම එහි සාර්ථකත්වය උදෙසා ලබාදෙන හොඳම සහතිකයයි.

එසේනම් ඉදිරියටත් මිණි කැට බඳු වූ ගුණාත්මක රසවත් නිර්මාණ රැසක් ඔස්සේ හරවත් ඵලදායී මාධ්‍ය මෙහෙවරක යෙදීමට සැලසිනෙ අප සූදානම්.

# මූල්‍ය අංශය

සැලසිනේ ආයතනයේ ගිණුම් අංශයේ කටයුතු වඩාත් කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට සැලසුම් කරන ලදි. ඒ තුළින් පෙරට වඩා වැඩි කාර්යක්ෂමතාවයක් ඇති කිරීමට හැකි විය.

ගිණුම් වාර්තා සකස් කිරීම කඩිනමින් සිදු කරන ලදි. 2011, 2012, 2015 යන වර්ෂවලදී මෙන්ම නැවත වරක් 2016.12.31 දිනට සැලසිනෙ රූපවාහිනී ආයතනයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයන් පෙන්නුම් කරන බවට විගනකාධිපති මතයක් පල කිරීම සැලකිය යුතු ජයග්‍රහණයක් බව මෙහිලා විශේෂයෙන් සඳහන් කරමි.

විගනකාධිපතිතුමාගේ මතය ඉහළ මට්ටමකට ගෙනඒමට ගිණුම් අංශය ඉදිරියේදීද ඇප කැපවී කටයුතු කරනු ලැබේ. මේ සඳහා ගිණුම් අංශයේ නිලධාරීන් හට පුහුණු අවස්ථා ලබා දීම තුළින් ඔවුන්ගේ හැකියාවන් හා දැනීම වැඩි දියුණු කිරීමට කටයුතු යොදනු ලැබේ.

# ඉසව් කළමනාකරණ අංශය

2015 වර්ෂයේ නව අංශයක් ලෙස ආරම්භ කරන ලද ඉසව් කළමනාකරණ අංශය ආයතනයේ ආදායම් ඉපයීම උදෙසා ඉතා සීඝ්‍ර දායකත්වයක් ලබා දෙන අංශයක් බවට මේ වන විට පත්ව තිබේ. නව දැක්මක් සහිතව වෙනස් වූ ක්‍රමවේදයකින් ඉසව් කළමනාකරණයට නව්‍යවාදී මුහුණුවරක් ඇති කිරීමට වර්තමානයේ මෙම අංශය සමත්ව සිටී.

2015 වර්ෂයේ මිලියන 36 ක ආදායමක් ලබා ගත් ඉසව් කළමනාකරණ අංශය 2016 වර්ෂයේදී මිලියන 48 ක ආදායමක් ලබමින් සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කර තිබේ. ඒ සඳහා පහත සඳහන් ප්‍රමුඛතම ඉසව් කළමනාකරණ කටයුතු දායකත්වය ලබා දී තිබේ.

- මහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලැබූ මහා මාර්ග සංවර්ධන අධිකාරියේ 30 වසරක සැමරුම
- ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් සංවිධානය කරනු ලැබූ ජාතික මහා ක්‍රීඩා උළෙල
- මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය සංවිධානය කරනු ලැබූ අමාත්‍යාංශයේ ඉදිරි දැක්ම වැඩසටහන
- කෘෂිකර්ම අමාත්‍යාංශය සංවිධානය කරනු ලැබූ ජාතික කෘෂි සමුළුව

උක්තව සඳහන් වැඩසටහන් සඳහා ඉසව් කළමනාකරණ කටයුතු අප ආයතනයේ ඉසව් අංශයෙන් සිදු කල අතර එම ඉසව් ඉතාමත් විචිත්‍රවත් හා සාර්ථක අයුරින් නිම කිරීමට අප ආයතනයට හැකියාව ලැබිනි. මෙම අත්දැකීම් හා ආදායම් පිළිබඳව මනා විශ්ලේෂනයන් කරමින් 2017 වර්ෂයේ ආදායම තවදුරටත් වර්ධනය කර ගැනීම මෙම අංශයේ අරමුණයි.


# වෙබ් නිර්මාණ අංශය

ආයතනය විසින් අළුතින් ස්ථාපනය කරන ලද අංශයක් ලෙස වෙබ් නිර්මාණ සහ තොරතුරු තාක්ෂණ අංශය සැලසිනේ ප්‍රතිරූපය නංවාලීම හා ප්‍රවර්ධනය කිරීමට සුවිශාල දායකත්වයක් ලබාදෙමින් සිටියි. සුවිශාල පරාසයක් පුරා පැතිර තිබෙන ඩිජිටල් මාධ්‍ය අවකාශය තුළ රාජ්‍ය මෙන්ම පෞද්ගලික ව්‍යවසායන්ට ද පුළුල් ප්‍රචාරණ අවස්ථා ලබා දෙමින් ආයතනයේ ලාභ උපරිම කිරීමට දායකවීම ද මේ අංශයේ අරමුණ වී තිබේ.




# මූල්‍ය වාර්තා 2016


## ආදායම් වර්ධනය




## පසුගිය වසර පහ තුළ දළ ලාභයේ ප්‍රවණතාවය



# 2012 - 2016 වසර අතර ආයතනික ලාභයේ උපනතිය



# මූල්‍ය වාර්තා සඳහා සටහන්

## 2016 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ගිණුම් ප්‍රතිපත්ති

**1. පොදු කරුණු**

1.1 සංයුක්ත තොරතුරු

සැලසිනෙ රූපවාහිනී ආයතනය (මින් පසු සැලසිනෙ නාමයෙන් හැඳින්වෙන) 2017. 06. 09 වෙනි දිනැති අංක 2022/34 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි විෂය පථයට ඇතුළත් කෙරිණි.

1.2 මූලික කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය

ප්‍රචාරණය, රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම ඉසව් කළමනාකරණය සැලසිනෙහි මූලික කාර්යයන් අතර ප්‍රධාන තැනක් ගනියි.

1.3 සේවක ප්‍රමාණය

2016.12.31 වෙනි දින වනවිට ස්ථිර සේවකයින් 14 ක් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 56 ක් සිට ඇත.

**2. ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳව සුවිශේෂී කරුණුවල සංක්ෂිප්තය**

2.1 පොදු ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශනයක් සකස් කර ඇත්තේ පොදුවේ පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මඟ පෙන්වීම යටතේ පවත්නා ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලව ය. ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ සකස්කර ඇති අතර දිගින් දිගටම පවත්වා ගැනීමේ පදනම මත ඉදිරිපත් කර ඇත.

2.2 ස්ථායීතාවය සහ සැසැඳුම්

මෙම වසර සඳහා යොදා ගන්නා ලද ගිණුම් ප්‍රතිපත්ති පසුගිය වසරේ දී යොදා ගත් ප්‍රතිපත්ති සමඟ අනුකූල වේ.

2.3 ණය පිරිවැය

මෙහි ණය පිරිවැය හඳුනාගෙන ඇත්තේ අදාළ ගිණුම් කාලය තුළ දරන ලද වියදම් ලෙස ය.

**3. වත්කම් තක්සේරුව සහ එහි ඇගයුම් පදනම**

3.1 දේපල, පිරියත සහ උපකරණ

පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය මත දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ වාර්තා සකස් කර ඇත.

3.2 වෙළෙඳ හා ලැබිය යුතු වෙනත් දෑ

වෙළෙඳ හා ලැබිය යුතු වෙනත් දෑ ඇස්තමේන්තු කළ උපලබ්ධි අගය මත සඳහන් කර ඇත.

3.3 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ සඳහා අතැති මුදල් සහ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු කෙටිකාලීන ඉහළ ද්‍රව ශීලතාවය ඇති ආයෝජන මෙයට ඇතුළත් වේ.

3.4 කල්බදු වත්කම්

කල්බදු පිළිබඳ නියමයන් හි දී අයිතිය දැක්වෙන සියලු අවදානම් සහ පාරිතෝෂිකයන් මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කිරීම සැලසිනෙ උපකල්පනය කරයි. කල්බදු පිළිබඳ මූලික හඳුන්වාදීමේ දී එහි අවම කල්බදු ගෙවීමේ දී එහි සාධාරණ අගයේ සහ වර්තමාන අගයන්ට වඩා අඩු සමානත්වයක් ගණනය කිරීමේ දී සිදුවේ. මූලික හැඳින්වීමෙන් අනතුරුව වත්කම් සඳහා යොදා තිබෙන ගිණුම් ප්‍රතිපත්තීන්ට අනුකූලව වත්කම් ගණනය කරනු ලැබීය.

3.5 ක්ෂය කිරීම්

ආදායම් ප්‍රකාශය තුළ ක්ෂය වීම් ලෙස හඳුන්වනු ලැබුණේ ප්‍රයෝජනයට ගත හැකි යැයි ඇස්තමේන්තු ගතකර තිබෙන වත්කම් පදනම් කරගත් සරල මාර්ග ක්‍රමය යොදා ගනිමිනි. මූල්‍ය කල්බදු යටතේ පවතින කෙටිකාලීන හා ප්‍රයෝජනයට ගත හැකි සමාන වටිනාකම් සහිත වත්කම් මත ක්ෂය කිරීම් සිදුකර ඇත.

දේපල, පිරියත හා උපකරණ අයිතමයන්ගේ ක්ෂය අනුපාතයන් පහත දැක්වේ.

| | |
|---|---|
| ලී බඩු හා සවිකිරීම් | වර්ෂ 2 - 10 |
| පරිගණක උපාංග | වර්ෂ 3 - 5 |
| කාර්යයාලීය උපකරණ | වර්ෂ 10 |
| මෝටර් වාහන | වර්ෂ 05 |
| කැමරා උපකරණ | වර්ෂ 10 |
| ගිණුම්කරණ මෘදුකාංග | වර්ෂ 10 |

**4. වගකීම් හා ප්‍රතිපාදන**

4.1 ශේෂ පත්‍ර දින සිට වසරක කාලයක් තුළ ඉල්ලුම මත ගෙවීමට ඇති ජංගම වගකීම් ශේෂ පත්‍රයෙහි වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. ශේෂ පත්‍ර දින සිට වසරක කාලයකට පසුව ගෙවීමට නියමිත වගකීම් දීර්ඝ කාලීන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

4.2 විශ්‍රාම හා පාරිතෝෂික දීමනා

සේවක ප්‍රතිලාභ - SLAS 16 (සංශෝධිත 2006) විධිවිධානයන් යටතේ සියලු සේවකයන්ගේ විශ්‍රාමික ප්‍රතිලාභ සේවයේ පළමු වසරේ සිටම ප්‍රතිපාදනය කර ඇත.

1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනතට අනුකූලව ඒ යටතේ වසර 5 ක් එක දිගට පවත්වාගෙන ගොස් සේවය අවසන් කරන්නා වූ සේවකයින් සඳහා වන වගකීමක් ලෙස ප්‍රතිපාදන වෙන් කර ඇත.

4.3 අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවය අවසන් කළ සේවකයන් සඳහා ප්‍රතිලාභ සැලසුමක් ලෙස යම්කිසි අයතනයක් මගින් තවත් ආයතනයකට ගෙවන්නා වූ ස්ථිර දායකත්වයක් හැර තවදුරටත් වෙනත් ගෙවීමක් කිරීමට නෛතික හෝ අර්ථකාරී බැඳීමක් නොමැති සේවක ප්‍රතිලාභ සැලසුමක් අර්ථ දැක්වූ දායකත්ව සැලසුමක් වේ. සියලුම සේවකයින් ආවරණය කරන පරිදි අර්ථසාධක හා භාරකාර අරමුදල් සඳහා දායකත්වය සැලසීමට ඇති බැඳීමකින් කරන ගෙවීම් ලාභාලාභ ගිණුම සඳහා වියදමක් ලෙස එය කරන්නා වූ අවස්ථාවේදී ම හඳුන්වනු ලැබේ. සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලව සේවායෝජකයාගේ දායකත්වය ලැබීමට සේවකයින් සුදුසුකම් ලබයි.

සේවක දල වැටුපෙන් 15%ක් හා 3%ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල් වෙත සැලසිනෙ දායකත්වය ලබාදෙයි.

**5. ආදායම් ප්‍රකාශය**

5.1 පිරිවැටුම

සැලසිනෙහි පිරිවැටුම ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ, උපලේඛනගත කිරීම්, ඉසව් කළමනාකරණය සහ රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය තුළින් ලැබේ.

5.2 ආදායම් හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා එන බවට සහ ඒ තුළින් විශ්වාසීව ස්ථිර ලෙස ආදායම් ගණනය කළ හැකි ලෙස ආදායම් ඉපැයීම අදායම් ලෙස හඳුනා ගැනේ.

5.3 වියදම් හඳුනා ගැනීම

ආදායම් ප්‍රකාශනයෙහි වියදම් හඳුනාගෙන ඇත්තේ දරන ලද පිරිවැය සහ විශේෂිත වූ ආදායම් අයිතමයන්හි ඉපැයීම් අතර ඍජු සම්බන්ධතාවයෙහි පදනම මතය.

**6. අදාළ පාර්ශ්ව අතර ගනුදෙනු**

ගිණුම් ප්‍රකාශනයෙහි සඳහන් කාලය තුළ අදාළ පාර්ශ්ව අතර ගනුදෙනු කිසිවක් සිදුකර නොමැත.

**7. ශේෂ පත්‍ර දිනයට සිදුවීම් වලට අදාල පසු ගැළපුම් සටහන්**

මූල්‍ය වාර්තාවෙහි හෙලිදරව් කළ යුතු හෝ ගැළපීම් කළ යුතු ප්‍රමාණාත්මක සිදුවීම් ශේෂ පත්‍ර දිනට පසු සිදු වී නොමැත.

**8. ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි ප්‍රමුඛ බැංකුවේ පැවති රු. 300,000.00 ක තැන්පතුව, ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ ගිණුමට මාරුකර ඇත.**

**9. 2011 වර්ෂයේ ණයගැති ලේඛනයෙන් කපා හැරීම්, සමුච්චිත ලාභයට ගලපා නිවැරදි කර ඇත.**

**10. ණයගැතියන් සඳහා අඩමාණ ණය ලෙස 2.5% ක් වෙන්කර තිබේ.**

**11. සේවකයන් දෙදෙනෙකුට විරුද්ධව ආයතනය විසින් නීතිමය පියවර ගත් අතර දැනට එම අයට අඩ වැටුප් ගෙවනු ලැබේ.**

**12. මෙහි සඳහන් විගණන විමසුම් 2.2.2 ඡේදය පරිදි ආයතනයේ වත්කම් නැවත ප්‍රති අගය 2017 වර්ෂයේදී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.**

# ආදායම් ප්‍රකාශය

**2016 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | සටහන් | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| ආදායම් | 11 | 397,692,282.97 | 267,617,260.35 | 450,068,680.36 |
| අඩු කළා : | | | | |
| සෘජු පිරිවැය | 12 | 342,085,817.84 | 229,795,974.66 | 403,588,539.17 |
| දළ ලාභය | | 55,606,465.13 | 37,821,285.69 | 46,480,141.19 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 13 | 4,783,264.44 | 4,076,455.43 | 5,482,485.88 |
| | | 60,389,729.57 | 41,897,741.12 | 51,962,627.07 |
| අඩු කළා : | | | | |
| පරිපාලන වියදම් | 14 | 60,652,532.58 | 50,801,729.30 | 43,287,100.36 |
| බෙදාහැරීමේ වියදම් | 15 | 15,840,372.40 | 12,436,455.71 | 2,904,277.17 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 16 | 5,592,569.72 | 432,525.00 | 403,516.67 |
| බොල් හා අඩමාණ ණය | - | (601,208.77) | 2,398,952.77 | 1,436,924.31 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ලාභය | - | (21,094,536.36) | (24,171,921.66) | 3,930,808.56 |
| අඩු කළා : | | | | |
| ක්ෂය වීම් | 17 | 4,353,470.40 | 4,213,138.17 | 4,348,682.00 |
| | | (25,448,006.76) | (28,385,059.83) | (417,873.44) |
| අඩු කළා : | | | | |
| මූල්‍ය පිරිවැය | 16.1 | 180,985.45 | 152,403.98 | 269,073.78 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (අලාභය) | | **(25,628,992.21)** | **(28,537,463.81)** | **(686,947.22)** |

# ශේෂ පත්‍රය

## 2016 දෙසැම්බර් මස 31 දිනට ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|
| **ස්ථාවර වත්කම්** | **සටහන්** | **රු.** | **රු.** | **රු.** |
| දේපළ, පිරියත හා උපකරණ | 18 | 12,608,937.31 | 18,479,716.12 | 20,900,866.22 |
| ගොඩනැගිලි | | 5,526,186.14 | 7,368,248.18 | 9,210,310.22 |
| | | **18,135,1123.45** | **25,847,964.30** | **30,111,176.44** |
| අස්පෘශ්‍ය වත්කම් | 18 A | 3,999,830.83 | - | - |
| **දිගුකාලීන ආයෝජන** | | | | |
| ස්ථාවර තැන්පතු | 19 | 898,200.00 | 898,200.00 | 78,411,550.41 |
| | | **23,033,154.28** | **26,746,164.30** | **108,522,726.85** |
| **ජංගම වත්කම්** | | | | |
| වෙළෙඳ හා ලැ/යු වෙනත් වත්කම් | 20 | 214,490,075.74 | 238,609,747.46 | 211,844,899.05 |
| තැන්පතු සහ පෙර ගෙවුම් | 21 | 1,944,593.80 | 752,235.75 | 65,000.00 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 22 | 8,559,416.92 | 8,685,944.63 | 14,848,009.71 |
| | | 224,994,086.46 | 248,047,927.84 | 226,757,908.76 |
| **මුළු වත්කම්** | | **248,027,240.74** | **274,794,092.14** | **335,280,635.61** |
| **ස්කන්ධය සහ වගකීම්** | | | | |
| ප්‍රාග්ධනය සහ සංචිත | | - | - | - |
| සමුච්චිත ලාභය/ (අලාභය) | | 57,883,448.68 | 98,854,157.55 | 82,161,327.11 |
| | | **57,883,448.68** | **98,854,155.92** | **82,161,327.11** |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| උපචිත පාරිතෝෂික දීමනා | 23 | 8,639,956.56 | 6,930,220.29 | 5,490,466.66 |
| මහා භාණ්ඩාගාර ණය | | 465,000.00 | 1,860,000.00 | 3,720,000.00 |
| | | **9,104,956.56** | **8,790,220.29** | **9,210,466.66** |
| **ජංගම වගකීම්** | | | | |
| කල්බදු ණය පොලී | 24 | - | 384,615.48 | 686,596.63 |
| වෙළෙඳ හා ගෙ/ යු වෙනත් වියදම් | 25 | 179,049,283.50 | 164,775,546.82 | 240,606,949.21 |
| අත්තිකාරම් ලැබීම් | | 129,552.00 | 129,552.00 | 755,296.00 |
| මහා භාණ්ඩාගාර ණය | | 1,860,000.00 | 1,860,000.00 | 1,860,000.00 |
| **මුළු වගකීම්** | | **181,038,835.50** | **167,149,714.30** | **243,908,841.84** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **248,027,240.74** | **274,794,092.14** | **335,280,635.61** |

සත්‍ය බවට අධ්‍යක්ෂකවරු විසින් සහතික කරන ලදී.

අත්සන් කලේ,

ශාන්ත බණ්ඩාර ජයවර්ධන
සභාපති,
සැලසිනෙ රූපවාහිනී ආයතනය

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2016 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | | |
| ආදායම් බද්දට පෙර ශුද්ධ ලාභය | (25,628.992.21) | (28,537,463.81) |
| **ගැලපීම් :** | | |
| පොලී වියදම් | 24,001.85 | 72,694.28 |
| පොලී ආදායම් | (145,449.20) | (3,340,568.09) |
| දේපල පිරියත හා උපකරණ මත ක්ෂය වෙන් කිරීම් | 4,353,470.40 | 4,213,138.17 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 2,534,524.27 | 1,566,953.64 |
| සමුච්චිත අරමුදලට පසුගිය වර්ෂය සඳහා ගැලපීම් | (15,341,716.66) | 45,230,294.25 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය** | (34,204,161.55) | 19,205,048.44 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබීම් (වැඩිවීම්/ අඩුවීම්) | 24,312,157.75 | (26,764,848.41) |
| තැන්පත් සහ කලින් කළ ගෙවීම් (වැඩිවීම්/ අඩුවීම්) | (1,192,358.05) | (687,235.75) |
| වෙළෙඳ ණය හිමියෝ හා අනෙකුත් ගෙවීම් (වැඩිවීම්/ අඩුවීම්) | 14,273,736.68 | (75,831,402.39) |
| ගොඩනැගිලි වියදම් සඳහා ප්‍රතිපාදනය (වැඩිවීම්/ අඩුවීම්) | - | 1,842,062.04 |
| ලද අත්තිකාරම් (වැඩිවීම්/ අඩුවීම්) | - | (625,744.00) |
| **මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල්** | **3,189,374.83** | **(82,862,120.07)** |
| පාරිතෝෂික ගෙවීම් | 824,788.00 | 127,200 |
| පොලී ගෙවීම් | - | - |
| | **4,014,162.83** | **(82,734,920.07)** |

## 2016 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල්** | | |
| දේපල පිරියත හා උපකරණ මිලට ගැනීම් | (2,482,522.42) | (1,420,222.25) |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | - | 77,513,350.41 |
| පොලී ආදායම් | 145,449.20 | 3,340,568.09 |
| **මෙහෙයුම් ක්‍රියාවලියේ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(2,337,073.22)** | **79,433,696.25** |
| **මූල්‍ය ක්‍රියාවලියේ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| භාණ්ඩාගාර ණය ලැබීම් | (1,395,000.00) | (1,860,000.00) |
| ණය නැවත ගෙවීම් | (408,617.33) | (496,526.29) |
| කල් බද්ධ ගෙවීමේ දී වූ වරද නිවැරදි කිරීම | - | (504,314.96) |
| **මූල්‍ය ක්‍රියාවලියේ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(1,803,617.33)** | **(2,860,841.25)** |
| **මුදල් හා ද්‍රවශීලතාවයේ ශුද්ධ වැඩිවීම / අඩුවීම** | **(126,527.72)** | **(6,162,065.07)** |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා ද්‍රවශීලතාවය (සටහන් A)** | **8,685,944.63** | **14,848,009.70** |
| **වර්ෂය අවසානයේ මුදල් හා සමාන දෑ (සටහන් A)5** | **8,559,416,91** | **8,685,944.63** |

| | | |
|---|---|---|
| **සටහන් A** | | |
| **මුදල් සහ මුදල් සමාන දෑ** | | |
| ලංකා බැංකුව ජංගම ගිණුම් අංකය - 2323299 | 3,251,155.41 | 1,063,567.06 |
| ලංකා බැංකුව ඉතිරි කිරීමේ ගිණුම් අංකය - 2329765 | 1,662,698.51 | 5,798,251.57 |
| නිෂ්පාදන අත්තිකාරම් | 2,090,853.00 | 1,595,626.00 |
| අනෙකුත් අත්තිකාරම් | 1,554,710.00 | 228,500.00 |
| | **8,559,416.92** | **8,685,944.63** |

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

## 2016 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **11. සේවා සැපයීමෙන් ලබන ආදායම්** | | | |
| නිෂ්පාදන | 19,865,749.83 | 15,921,580.75 | 39,809,755.67 |
| ග්‍රැෆික් | 13,492,843.62 | 21,276,109.47 | 24,569,248.77 |
| උපලේඛනගත කිරීම් | 314,834,334.00 | 193,993,826.89 | 334,587,225.95 |
| ඉසව් | 48,150,355.52 | 36,425,743.24 | - |
| වෙනත් | 84,000.00 | - | 103,028,945.78 |
| වෙබ් | 1,265,000.00 | - | - |
| අඩු කලා : ආදායම මත අලෙවි බද්ද | - | - | (51,926,495.81) |
| | **397,692,282.97** | **267,617,260.35** | **450,068,680.36** |
| **12. සෘජු පිරිවැය** | | | |
| නිෂ්පාදන වියදම් | 17,141,833.00 | 12,756,525.65 | 26,091,223.36 |
| ග්‍රැෆික් වියදම් | 13,965,362.04 | 19,381,442.68 | 18,524,177.70 |
| උපලේඛනගත වියදම් | 272,997,261.84 | 156,980,159.97 | 275,960,848.63 |
| ඉසව් | 36,804,690.96 | 40,677,846.36 | - |
| වෙනත් වියදම් | - | - | 118,290,681.55 |
| "ඇමතුම් මධ්‍යස්ථාන" ව්‍යාපෘතිය | - | - | - |
| වෙබ් | 1,176,670.00 | - | - |
| අඩු කලා : ආදායම මත අලෙවි බදු වියදම | - | - | (35,278,392.07) |
| | **342,085,817.84** | **229,795,974.66** | **403,588,539.17** |
| **13. වෙනත් මෙහෙයුම් ආදායම්** | | | |
| සේවක ණය පොලී | 107,321.49 | 76,971.89 | 92,230.84 |
| බැංකු පොලී | 145,449.20 | 3,340,568.09 | 3,944,376.12 |
| වෙනත් පොලී | 4,425,393.75 | 281,000.00 | 572,467.20 |
| සැපයුම්කරුවන් ලියාපදිංචිය | 9,500.00 | 111,500.00 | 873,411.72 |
| නිර්මාණ ගාස්තු | - | 126,000.00 | - |
| පරිවර්ථන ගාස්තු | 80,000.00 | - | - |
| ප්‍රවාහන ගාස්තු | 15,600.00 | 140,415.45 | - |
| | **4,783,264.44** | **4,076,455.43** | **5,482,485.88** |

## 2016 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **14. පරිපාලන වියදම්** | | | |
| වැටුප් හා වේතන | 31,958,987.77 | 29,069,519.36 | 18,143,731.32 |
| සේවක අර්ථසාධක අරමුදල | 2,436,156.27 | 2,072,097.63 | 1,729,198.60 |
| සේවක භාරකාර අරමුදල | 429,730.96 | 414,419.84 | 345,839.96 |
| සේවක අතිකාල සහ යැපීම් දීමනා | 1,775,515.02 | 1,277,369.38 | 2,189,593.59 |
| දුරකථන ගාස්තු | 515,270.46 | 382,777.86 | 498,026.48 |
| සේවක සුභසාධනය | 793,292.59 | 506,004.59 | 1,873,981.52 |
| තැපැල් | 38,141.00 | 37,375.48 | 43,135.00 |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 1,534,437.69 | 802,975.27 | 1,310,442.60 |
| විගණන ගාස්තු | 110,000.00 | 192,120.00 | 250,000.00 |
| පුහුණු කිරීමේ වැඩසටහන් | 447,865.60 | 50,000.00 | 41,500.00 |
| වාහන කුලී | 780,000.00 | 1,140,000.00 | 585,000.00 |
| විදුලිය | 462,481.24 | 297,898.14 | 209,032.73 |
| ප්‍රසාද දීමනා | 680,500.00 | 720,000.00 | 720,187.00 |
| පාරිතෝෂික දීමනා | 2,534,524.27 | 1,566,953.64 | 1,130,377.29 |
| අධ්‍යක්ෂ වේතන | 647,483.33 | 1,187,364.28 | 676,275.00 |
| දීමනා - සභාපති | 1,500,000.00 | - | - |
| දීමනා - කොන්ත්‍රාත් | 712,150.00 | 500,000.00 | - |
| දීමනා - ඉන්ධන | 448,100.32 | 457,264.84 | - |
| දීමනා - දුරකථන | 156,000.00 | 119,964.29 | - |
| දීමනා - ප්‍රවාහන | 560,000.00 | - | - |
| දීමනා - පුහුණු | 652,133.00 | 329,989.25 | - |
| ජලය | 156,927.90 | 76,334.02 | 92,331.76 |
| ලියාපදිංචි ගාස්තු | 119,000.00 | 74,540.00 | 16,413.60 |
| අලුත්වැඩියා හා නඩත්තු - කාර්යාලීය උප. | 81,088.00 | 350,300.00 | 1,094,668.00 |
| අලුත්වැඩියා හා නඩත්තු - නිෂ්. උපකරණ | 96,466.00 | 217,653.39 | 335,866.80 |
| පුවත්පත් වියදම් | 60,492.00 | 64,975.00 | 70,370.60 |
| ආගමික සහ සංස්කෘතික වියදම් | - | 4,985.00 | - |
| සාමාජීය සුභසාධන | 75,500.00 | 59,897.00 | 295,146.86 |
| ගොඩනැගිලි වියදම් | 1,842,062.04 | 1,842,062.04 | 2,302,577.55 |
| වෘත්තීය ගාස්තු | - | 140,000.00 | 407,875.00 |
| උපදේශක ගාස්තු | - | 15,000.00 | - |
| ආරක්ෂක සේවා වියදම් | 1,151,172.00 | 657,600.00 | - |
| ටෙන්ඩර් ගාස්තු | 32,000.00 | 29,000.00 | 2,500.00 |
| පරිවර්තන ගාස්තු | 261,500.00 | 137,350 | 37,200.00 |
| සේවක රක්ෂණ | 1,451,568.31 | 1,282,879.58 | 2,105,263.72 |
| වෙබ් අඩවි යාවත්කාලීන කිරීමේ වියදම් | 17,920.00 | 25,450.00 | 5,850.00 |
| අන්තර්ජාල වියදම් | 203,030.66 | 253,449.27 | - |
| විදේශ ගමන් වියදම් | 298,759.80 | - | 1,103,121.00 |

## 2016 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| අධ්‍යක්ෂක මණ්ඩල දීමනා | - | - | 247,500.00 |
| නවාතැන් | - | - | 138,340.00 |
| වෙළඳ දැන්වීම් | - | - | 241,600.00 |
| ගොඩනැගිලි කුලී වියදම් - ජාතික චිත්‍රපට සංස්ථාව | 3,780,000.00 | 3,780,000 | 3,150,000.00 |
| ගොඩනැගිලි කුලී වියදම් - රාජගිරිය කාර්යාලය | 565,390.32 | | |
| පිරිසිදු කිරීමේ වියදම් | 119,658.00 | 28,981.26 | 62,320.00 |
| පරිගණක අලුත් වැඩියා වියදම් | 118,041.11 | 37,178.89 | 27,450.00 |
| ආධාර | 453,199.56 | 68,000.00 | 165,000.00 |
| ආහාර වියදම් | - | - | 127,500.00 |
| සම්බන්ධීකාරණ ගාස්තු | 170,900.00 | - | - |
| සාද | - | - | 252,000.00 |
| තෑගි වියදම් | 288,000.00 | 532,000.00 | 267,000.00 |
| මුද්‍රණ වියදම් | 14,587.00 | - | - |
| ටී - ෂර්ට් | - | - | 49,720.00 |
| නිර්මාණ ගාස්තු | 95,000.00 | - | - |
| කාර්යාල වියදම් | | - | 943,164.38 |
| ගිවිසුම් අලුත් කිරීම | 27,500.00 | - | - |
| | **60,652,532.58** | **50,801,729.30** | **43,287,100.36** |

### 15. බෙදාහැරීමේ වියදම්

| | 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| ඉන්ධන | 837,935.89 | 861,068.32 | 1,196,220.65 |
| විශේෂ වට්ටම් | 12,467,591.92 | 10,111,720.38 | - |
| මෝටර් රථ අලුත් වැඩියා සහ නඩත්තු | 1,111,799.26 | 495,798.36 | 595,944.54 |
| ප්‍රවාහන, ගමන් ගාස්තු හා නවතා තැබීම් | 215,143.96 | 75,921.74 | 582,242.07 |
| අලෙවි ප්‍රවර්ධන වියදම් | 85,630.00 | 31,630.00 | 66,500.00 |
| අලෙවි දිරි දීමනා | 921,832.46 | 783,132.78 | 251,262.41 |
| වාහන රක්ෂණය | 200,438.91 | 77,184.13 | 212,107.50 |
| | **15,840,372.40** | **12,436,455.71** | **2,904,277.17** |

### 16. වෙනත් මෙහෙයුම් වියදම්

| | 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| සේවක වන්දි | 350,000.00 | - | - |
| වියදම් - රාජගිරිය කාර්යාලය | 33,208.00 | - | - |
| විවිධ වියදම් | 322,722.55 | - | 163,516.67 |
| නෛතික වියදම් | 730,800.00 | 351,375.00 | 240,000.00 |
| වෙනත් වියදම් | 4,149,328.97 | 81,150.00 | - |
| අධිභාර වියදම් | 6,510.20 | - | - |
| | **5,592,569.72** | **432,525.00** | **403,516.67** |

## 2016 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **16. (1) මූල්‍ය පිරිවැය** | | | |
| බැංකු ගාස්තු | 134,538.70 | 61,433.53 | 98,507.20 |
| බලපත්‍ර හා රක්ෂණ ගාස්තු | 15,157.48 | 18,276.17 | - |
| කල් බදු පොළී | 24,001.85 | 72,694.28 | 170,566.58 |
| රැඳවුම් බද්ද | 7,287.42 | - | - |
| | **180,985.45** | **152,403.98** | **269,073.78** |
| **17. ක්ෂය වීම** | | | |
| ලී බඩු සහ සවිකිරීම | 181,293.13 | 153,490.70 | 161,512.00 |
| පරිගණක උපාංග | 763.162.80 | 690,976.00 | 735,979.00 |
| කාර්යාල උපකරණ | 186,713.00 | 164,201.00 | 245,797.00 |
| මෝටර් රථ | 1,567,164.80 | 1,567,164.80 | 1,567,165.00 |
| කැමරා සහ උපකරණ | 1,098,850.60 | 1,083,546.60 | 1,173,779.00 |
| ගිණුම්කරණ මෘදුකාංග | 214,331.00 | 211,804.00 | 209,134.00 |
| ජාලකරණ මෙහයුම් | 341,955.07 | 341,955.07 | 255,316.00 |
| | **4,353,470.40** | **4,213,138.17** | **4,348,682.00** |

**18. (1) දේපළ පිරියත හා උපකරණ**

| | 2016.01.01 දිනට පිරිවැය | එකතු කිරීම් | ඉවත් කිරීම් | 2016.12.31 දිනට පිරිවැය |
|---|---|---|---|---|
| ලී බඩු සහ සවිකිරීම | 2,646.556.75 | 546,966.54 | - | 3,193,523.29 |
| පරිගණක උපාංග | 6,201,213.00 | 658,150.00 | - | 6,859,363.00 |
| කාර්යාල උපකරණ | 3,315,793.00 | 387,405.88 | - | 4,303,198.88 |
| මෝටර් රථ | 9,080,824.00 | - | - | 9,080,824.00 |
| කැමරා සහ උපකරණ | 14,512,900.00 | 245,000.00 | - | 14,757,900.00 |
| | **35,757,286.75** | **2,437,522.42** | **-** | **38,194,809.17** |

**18. (2) ක්ෂය වීම්**

| | 2016.01.01 දිනට පිරිවැය | එකතු කිරීම් | ඉවත් කිරීම් | 2016.12.31 දිනට පිරිවැය |
|---|---|---|---|---|
| ලී බඩු සහ සවිකිරීම | 1,264,975.70 | 18,293.13 | - | 1,446,268.83 |
| පරිගණක උපාංග | 4,358,794.43 | 763,162.80 | - | 5,121,957.23 |
| කාර්යාල උපකරණ | 2,009,544.00 | 186,713.00 | - | 2,196,257.00 |
| මෝටර් රථ | 7,182,257.80 | 1,567,164.80 | - | 8,749,422.60 |
| කැමරා සහ උපකරණ | 6,973,115.60 | 1,098,850.60 | - | 8,071,966.20 |
| | **21,788,687.53** | **3,797,184.33** | **-** | **25,585,871.86** |
| ශුද්ධ පොත් අගය | **13,968,599.22** | | | **12,608,937.31** |

## 2016 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

### 18. (A) අස්පෘශ්‍ය වත්කම්

| | 2016.01.01 දිනට පිරිවැය | එකතු කිරීම් | ඉවත් කිරීම් | 2016.12.31 දිනට පිරිවැය |
|---|---|---|---|---|
| ගිණුම්කරණ මෘදුකාංග | 2,576,500.00 | 45,000.00 | - | 2,621,500.00 |
| ජාලකරණ මෙහයුම් | 3,419,650.72 | - | - | 3,419,650.72 |
| | **5,996,150.72** | **45,000.00** | **-** | **6,041,150.72** |

### 18. (A) ක්‍රමක්ෂය

| | 2016.01.01 දිනට පිරිවැය | එකතු කිරීම් | ඉවත් කිරීම් | 2016.12.31 දිනට පිරිවැය |
|---|---|---|---|---|
| ගිණුම්කරණ මෘදුකාංග | 887,762.75 | 214,331.00 | - | 1,102,093.75 |
| ජාලකරණ මෙහයුම් | 597,271.07 | 341,955.07 | - | 939,226.14 |
| | **1,485,033.82** | **556,286.07** | **-** | **2,041,319.89** |
| | **4,511,116.90** | | | **3,999,830.83** |

| | 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **19. ස්ථාවර තැන්පතු** | | | |
| ලංකා බැංකුව - ගිණුම් අංක 742656 | 500,000.00 | 500,000.00 | 500,000.00 |
| ලංකා බැංකුව - ගිණුම් අංක 73404 | - | - | 10,000,000.00 |
| ලංකා බැංකුව - ගිණුම් අංක 73405 | - | | 12,306,821.41 |
| ප්‍රමුඛ බැංකුව - 103009002920 (ශ්‍රී ලංකා ඉතිරි කිරීම) | - | | |
| ලංකා බැංකුව - ගිණුම් අංක 74798 | - | | 12,135,172.00 |
| ලංකා බැංකුව - ගිණුම් අංක 74401 | - | | 26,000,000.00 |
| ලංකා බැංකුව - ගිණුම් අංක 75021610 | - | - | 2,071,357.00 |
| ලංක බැංකුව - ගිණුම් අංක 76055217 | - | - | 15,000,000.00 |
| ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව | 398,200.00 | 398,200.00 | 398,200.00 |
| | **898,200.00** | **898,200.00** | **78,411,550.41** |

## 2016 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **20. වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ (21.1)** | | | |
| වෙළෙඳ ණයගැතියෝ **(20.1)** | 190,632,488.52 | 211,319,015.75 | 180,923,769.64 |
| උත්සව අත්තිකාරම් | 271,500.00 | 203,000.00 | 141,500.00 |
| සේවක ණය | 2,555,730.00 | 1,506,668.50 | 1,959,742.00 |
| වැටුප් අත්තිකාරම් | 21,000.00 | 21,000.00 | 21,000.00 |
| ලැබිය යුතු රක්ෂණ වාරික | 224,731.81 | 103,866.72 | - |
| බැංකු ඇපකර | 693,237.91 | 979,868.68 | - |
| රඳවා ගැනීමේ බදු | - | 5,917,583.31 | 4,556,283.00 |
| ආර්ථික සේවා ගාස්තු | 3,559,744.00 | 3,599,744.00 | 3,599,744.00 |
| උපාලි පුවත්පත් | 10,695.00 | 10,695.00 | 10,695.00 |
| සීමාසහිත එක්සත් පුවත්පත් සමාගම | 2,538,028.86 | 2,538,028.86 | 2,500,181.00 |
| විජය පුවත්පත් | 188,650.74 | 188,650.74 | 172,245.00 |
| ඊ.ඩී.පී. ආයතනය | 3,004.00 | 3,004.00 | 3,004.00 |
| ශ්‍රී ලංකා රූපවාහිනිය සංස්ථාව - කොමිස් | 63,558.00 | 63,558.00 | 63,558.00 |
| ආපසු ලැබිය යුතු තැන්පතු | 1,312,000.00 | 110,000.00 | 200,000.00 |
| සෙලින්කෝ රක්‍ෂණ ආයතනය | 41,800.00 | 41,800.00 | 62,050.00 |
| ලැබිය යුතු බැංකු පොලී ආදායම | 39,819.68 | 25,300.00 | 5,643,127.41 |
| මුදල් වංචාව **(20.2)** | 11,988,000.00 | 11,988,000.00 | 11,988,000.00 |
| ලැබිය යුතු දඩ හා අධිභාරය | 148,333.72 | (10,036.10) | - |
| විවිධ ලැබිය යුතු | 140,251.50 | - | - |
| ඊ-මංසල පාලන ගිණුම | 17,502.00 | - | - |
| | **214,490,075.74** | **238,609,747.46** | **211,844,889.05** |
| **20.1 වෙළඳ ණයගැතියෝ** | | | |
| වෙළෙඳ ණයගැතියෝ 2016 දක්වා | 200,012,425.52 | 221,300,161.52 | 188,505,962.64 |
| අඩුකළා : | | | |
| බොල් ණය සඳහා වෙන්කිරීම් - 2016 | 9,379,937.00 | 9,981,145.77 | 7,582,193.00 |
| | **190,632,488.52** | **211,319,015.75** | **180,923,769.64** |

**20.2 සේවකයන් විසින් සිදුකළ මූල්‍ය වංචාව**

ආයතනයේ සේවකයන් විසින් කිසිදු අධිකාරියකින් තොරව ආයතනයේ මුදල් ලබා ගැනීම පිළිබඳව පොලිස් විමර්ෂණ කටයුතු කරමින් පවතින අතර, එම මුදල් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

## 2016 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **21. තැන්පතු සහ පෙර ගෙවුම්** | | | |
| පෙර ගෙවුම් වාහන කුළී | - | - | 65,000.00 |
| පෙර ගෙවුම් | 1,944,593.80 | 752,235.75 | - |
| | **1,944,593.80** | **752,235.75** | **65,000.00** |
| **22. මුදල් සහ මුදල් සමාන දෑ** | | | |
| ලංකා බැංකු ගිණුම - 2323299 | 3,251,155.41 | 1,063,567.06 | 7,311,326.85 |
| ලංකා බැංකු ඉතුරුම් ගිණුම - 2329765 | 1,662,698.51 | 5,798,251.57 | 6,988,582.86 |
| නිෂ්පාදන අත්තිකාරම් | 2,090,853.00 | 1,595,626.00 | 373,100.00 |
| අනෙකුත් අත්තිකාරම් | 1,554,710.00 | 228,500.00 | 175,000.00 |
| | **8,559,416.92** | **8,685,944.63** | **14,848,009.71** |
| **සමුච්චිත ලාභය / (අලාභය)** | | | |
| ඉදිරියට ගෙනා ශේෂය | 98,854,157.55 | 82,161,327.11 | 35,066,160.63 |
| එකතු කළා : කපාහරින ලද ආරම්භක ශේෂය | | | |
| | 98,854,157.55 | 82,161,327.11 | 35,066,160.63 |
| අඩු කළා : පෙර වර්ෂයේ ගැලපීම් 26 | 15,341,716.66 | 45,230,294.25 | 47,782,113.70 |
| | 83,512,440.89 | 127,391,621.36 | 82,848,274.33 |
| වර්ෂය සඳහා ලාභය / (අලාභය) | (25,628,992.21) | (28,537,463.81) | (686,947.22) |
| | **57,883,448.86** | **98,854,157.55** | **82,161,327.11** |
| **23. ගෙවිය යුතු පාරිතෝෂික දීමනා** | | - | - |
| ඉදිරියට ගෙනා ශේෂය | 6,930,220.29 | 5,490,466.65 | 4,430,647.00 |
| එකතු කළා - වාර්ෂික පාරිතෝෂික දීමනා | 2,534,524.27 | 1,566,953.64 | 1,130,377.29 |
| | 9,464,744.56 | 7,057,420.29 | 5,561,024.29 |
| අඩු කළා - පාරිතෝෂික ගෙවීම් | 824,788.00 | 127,200.00 | 70,557.64 |
| ගෙවිය යුතු පාරිතෝෂික දීමනා | **8,639,956.56** | **6,930,220.29** | **5,490,466.65** |

## 2016 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **24. ගෙවිය යුතු ණය පොලී** | | | |
| 3. මිට්සුබිෂි එල්. 300 - වෑන් පී.ඩී. - 0578 | 750,405.18 | 1,092,193.03 | 1,376,515.00 |
| අඩු කළා : වාර්ෂික ගෙවීම් | (365,789.48) | (341,787.85) | (284,321.97) |
| | **384,615.48** | **750,405.18** | **1,092,193.03** |
| අඩු කළා : ජංගම වගකීම් වලට මාරුකිරීම් | | - | (284,321.97) |
| ලංකා බැංකු බදු වාරික | 336,611.78 | 269,093.44 | 193,376.29 |
| ලංකා බැංකු බදු පොලී | 24,001.85 | 72,694.41 | 90,945.68 |
| | **24.001.85** | **408,617.33** | **807,871.05** |
| | - | **(24,001.85)** | **(121,274.42)** |
| විලම්භිත නොවන පොළී | - | 121,274.42 | 291,841.00 |
| වාර්ෂික ගෙවීම් | (24,001.85) | (97,272.54) | (170,566.58) |
| | **-** | **384,615.48** | **686,596.63** |
| **25. වෙළෙඳාම් සඳහා කළ යුතු ගෙවීම්** | | | |
| වෙලෙඳ ණයහිමියෝ | 113,449,211.21 | 108,960,599.32 | 142,712,254.00 |
| සේවක අර්ථ සාධක අරමුදල | - | 35,151.50 | 264,080.26 |
| සේවක භාරකාර අරමුදල | - | 3,383.33 | 29,836.97 |
| අතිකාල සහ යැපීම් දීමනා | - | 199,204.00 | - |
| සණස සමිතිය | - | 43,120.00 | 43,120.00 |
| දුරකථනය | 47,302.86 | 83,920.15 | 47,302.86 |
| ජලය | - | 11,373.62 | 67,609.26 |
| විදුලිය | - | 114,371.70 | 334,455.73 |
| අලෙවි දිරි දීමනා | 110,000.00 | - | - |
| එකතු කළ අගය මත බදු | 19,311,617.86 | 19,507,924.21 | 83,799,396.74 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 14,703,471.72 | 13,376,476.63 | 12,306,863.92 |
| ගෙවියයුතු ගොඩනැගිලි කුළී | 900,000.00 | - | 630,000.00 |
| විගණන ගාස්තුව | 172,500.00 | 70,000.00 | 2,880.00 |
| ඉන්ධන | 41,651.47 | 41,651.47 | 41,651.47 |
| වෙනත් ණයහිමියෝ | 4,061,815.30 | 293,212.65 | 327,498.00 |
| ගෙවිය යුතු වැටුප් | - | 143,960.83 | - |
| ගෙවිය යුතු වියදම් | 26,251,713.08 | 21,867,195.68 | - |
| ගෙවිය යුතු කල් බදු වාරික | - | 24,001.73 | - |
| | **179,049,283.50** | **164,775,546.82** | **240,606,949.21** |

## 2016 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **26. (1) පෙර වර්ෂයේ ගැලපීම්** | | | |
| අධිභාර | 70,249.81 | - | - |
| විගණන ගාස්තු | - | - | - |
| බැංකු ශේෂය | - | 328,901.43 | 60,460.12 |
| බැංකු පොළී 2015 | (5,390.00) | 98,200.00 | - |
| බැංකු පොළී 2015, වෙන් කිරීම් | - | (1,666,220.38) | - |
| විවිධ ලෙජර් ගිණුම් නිවැරදි කිරීම් | (6,812,992.15) | - | - |
| කල් බදු හිමියා | - | (64,634.30) | 173,961.44 |
| එකතු කළ අගය මත බදු | - | - | 27,821,085.00 |
| ජාතිය ගොඩනැගීමේ බදු | - | - | 8,338,251.04 |
| රඳවා ගැනීමේ බදු (2013) 2014 | (5,917,583.31) | 769,773.96 | - |
| ගෙ / යු ගොඩනැගිලි කුළී | (900,000.00) | - | 270,000.00 |
| ණයගැතියෝ | (1,741,596.01) | (2,711,141.07) | 11,118,356.10 |
| පෙර වර්ෂය සඳහා ක්ෂයවීම් | - | 371,765.82 | - |
| ණය හිමියෝ | (34,425.00) | 48,109,788.79 | - |
| අත්තිකාරම් | 20.00 | 58,860.00 | - |
| වාහන කුළී | - | (65,000.00) | - |
| | **(15,341,716.66)** | **45,230,294.25** | **47,782,113.70** |

### 27 ගොඩනැගිලි අලුත්වැඩියා වියදම්

ගොඩනැගිලි අලුත්වැඩියා සඳහා දරන ලද වියදම තුළ මුලධන ස්වරූපයේ වියදම් ද ඇතුළත් බැවින් සමාගම විසින් එම වියදම් ඇතිකරගත් බදු ගිවිසුම් ප්‍රකාරව වසර 5 ක කාල සීමාව තුළ ලියා හැරීමට කටයුතු කර ඇත.

### 28. සම්බන්ධිත පාර්ශ්වයන් හෙලිදරව් කිරීම (එස්. එල්. ඒ. එස්. 30)

| නම | තනතුර | සම්බන්ධතා පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ ස්වභාවය | ලිපිනය |
|---|---|---|---|
| 01. ශාන්ත බණ්ඩාර ජයවර්ධන | සභාපති | නැත | අංක. 21, එක්වත්ත පාර, නුගේගොඩ. |
| 02. සනත් ධර්මරත්න | සාමාන්‍යාධිකාරී | නැත | අංක. 81, ශාන්ත සර්වියස් පාර, ජාඇල. |

**2016 මුදල් වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනය සහ ඉහත දැක්වෙන එක් එක් පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සමඟ සම්බන්ධතා පාර්ශ්ව ගනුදෙනු සිදුනොවිය.**

# 2016 වසරේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව විගණකාධිපතිතුමාගේ මතය


විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல. / My No. } සීඑෆ්ඒස්/ඩී/එස්ඩීඅයි/06/16/104 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 අප්‍රේල් 11 දින

සභාපති,

සැලසිනේ රූපවාහිනි ආයතනය.

**සැලසිනේ රූපවාහිනි ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

සැලසිනේ රූපවාහිනි ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 ආයතනය පිහිටුවීම

සැලසිනේ රූපවාහිනි ආයතනය 2001 දෙසැම්බර් 20 දින ජනසන්නිවේදන අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබුණද, එහි අරමුණු හා කාර්යයන් නිශ්චය කර බලතල ක්‍රියාත්මක කිරීමට පනතකින් හෝ වෙනයම් නීතියකින් විධිවිධාන සලසා නොතිබුණි. මෙම ආයතනය "සැලසිනේ ලිමිටඩ්" ලෙස සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට 2009 වර්ෂයේ සිට කටයුතු කරමින් තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සැලසිනේ රූපවාහිනී ආයතනයේ , මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන්, පිරිවැය රු.4,000,000 ක් වූ වෑන් රථයක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ, ඇස්තමේන්තු ගත දෝෂය, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මෙම වාහනය පිරිවැය ඉක්මවා රු.511,269 ක් ක්ෂය කර තිබු අතර ඒ හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දින වත්කම්වල ශුද්ධ අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 මැයි 21 දින රු.1,935,000 කට ලබාගෙන තිබු මෝටර් රථයක් රු.1,613,750 ක් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මෝටර් වාහන අගය රු.321,250 ක් අඩුවෙන් ගිණුම්ගත කොට තිබිණි. එසේම 2013 වර්ෂයේ සිට අඩු පිරිවැය මත ක්ෂය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය වියදම 64,250 ක් අඩුවෙන් හා රඳවාගත් ලාභ රු. 230,230 ක් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ජාතික රූපවාහිනි සංස්ථාවට ගෙවිය යුතු රු.598,230 ක් සදොස් ලෙස ආයතනයේ වෙළඳ ණයගැති ශේෂයෙන් අඩුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ආයතනයේ නිලධාරීන් විසින් සිදුකළ රු.11,988,000 ක මූල්‍ය වංචාව මූල්‍ය ප්‍රකාශනවල නිශ්චිතව හෙළිදරව් කිරීමකින් තොරව සදොස් ලෙස වර්ගීකරණය කර ශේෂ පත්‍රයේ, වෙළඳ සහ අනෙකුත් ලැබීම්වලට එකතු කර දක්වා තිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය අනුව ජංගම නොවන වත්කම් වටිනාකම රු.38,194,809 ක් වුවද උපලේඛණය අනුව එම වටිනාකම රු.35,146,357 ක් වූයෙන් රු.3,048,452 ක වෙනසක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය අනුව උපචිත වියදම් රු.26,251,713 ක් වුවද උපලේඛන අනුව එම වියදම රු.26,354,214 ක් වූයෙන් රු.102,501 ක වෙනසක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය අනුව වෙළඳ ණයගැති ශේෂය රු.200,012,426 වුවද උපලේඛනය අනුව එම ශේෂය රු.201,303,503 ක් වූයෙන් රු.1,291,077 ක වෙනසක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට ගෙවිය යුතු ශේෂය රු.72,401,933 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එම සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් තහවුරු කර ගන්නා ලද ශේෂය රු.65,817,229 ක් වූයෙන් රු.6,584,704 ක වෙනසක් විය.

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | ගිණුම් විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | 29,113,985 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (ආ) | 2016 වර්ෂයට අදාළ ණයගැති ශේෂය | 6,611,743 | විස්තරාත්මක ණයගැති උපලේඛන ශේෂ සනාථන |
| (ඇ) | ලැබිය යුතු ආර්ථික සේවා බදු | 3,599,744 | ශේෂ සනාථන |
| (ඈ) | එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙන් ලැබිය යුතු ශේෂ | 2,538,029 | |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.190,632,488 ක් වූ වෙළඳ ණයගැති ශේෂ 110 කින් එකතුව රු.161,333,844 ක් වූ ණය ශේෂ 85 ක් සඳහා ශේෂ තහවුරු කිරීම් කැඳවා තිබුණි. ඉන් ණයගැති ශේෂ 13 කට පමණක් පිළිතුරු ලැබී තිබූ අතර සියයට 1.9 ක්වූ රු.3,084,183 ක වටිනාකමැති ශේෂ 3 ක් පමණක් සැසඳී තිබුණි. තවද ශේෂ තහවුරු කැඳවන ලද වටිනාකමින් රු.මිලියන 6 සිට මිලියන 47 ඉක්ම වූ රාජ්‍ය ආයතන හයක් ශේෂ තහවුරු කිරීම් ලබාදී නොතිබූ අතර මෙම ප්‍රමාණය මුළු වෙළඳ ණයගැතියන්ගෙන් සියයට 50 ක් විය.

(ආ) ඉහත මුළු ණයගැතියන්ගෙන් වසර 2 ඉක්මවූ වෙළඳ ණයගැති ශේෂය මුළු වෙළඳ ණයගැතියන්ගෙන් සියයට 50 ක් හෙවත් රු.95,761,058 ක්ද ඒ තුල ඇතුළත් වසර 10 ඉක්ම වූ ණය ශේෂය රු.6,611,748 ක්ද විය. එම ශේෂ හඳුනාගෙන අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල ජාතික රූපවාහිනී සංස්ථාවට ගෙවිය යුතු ලෙස රු.4,143,949 ක් දක්වා තිබුණද, රූපවාහිනී සංස්ථාවේ 2016 මූල්‍ය ප්‍රකාශන තුළ සැලසිනේ ආයතනයෙන් ලැබිය යුතු ලෙස කිසිදු වටිනාකමක් දක්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතු කල අගය මත බදු රු.19,311,618 ක් හා ජාතිය ගොඩනැගීමේ බදු රු.14,703,472 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමෙන් තොරව අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවතුණි.

## 2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති , රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 178 (3) (ආ) | ගෙවීම් වවුචර් සමග, අදාළ ගෙවීම සනාථ කිරීමට අවශ්‍ය ලිපි ලේඛන හා විස්තර අමුණා තිබිය යුතු වුවද දියවන්නාවේ දින දස දහසක් වැඩසටහනට අදාළව අවස්ථා 11 කදී සිදුකර තිබූ රු. 1,813,508 අත්තිකාරම් පියවීම් සඳහා අදාළ බිල්පත් වවුචරයට අමුණා නොතිබුණි. |
| (ii) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (ආ) | • කිසියම් නිශ්චිත කාර්යයක් සඳහා ලබා දෙන ලද අත්තිකාරම් මුදලක් එම කාර්ය නිමකළ වහාම පියවිය යුතු වුවත් ආයතනය විසින් අවස්ථා 13 කදී නිෂ්පාදන අත්තිකාරම් ලෙස ලබාදුන් එකතුව රු.1,930,012 ක් හා අවස්ථා 3 කදී වෙනත් අත්තිකාරම් ලෙස ලබාදුන් එකතුව රු.1,370,000 ක් 2017 ජුනි 30 දින වන විටත් පියවා නොතිබුණි.<br><br>• මාණ්ඩලික නිලධාරියකුට පමණක් අත්තිකාරම් ලබාදිය යුතු වුවත්, ආයතනය විසින් |

7

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

අවස්ථා 11 කදී මාණ්ඩලික නොවන නිලධාරීන් වෙත රු. 3,195,500 ක අත්තිකාරම් ලබා දී තිබුණි.

- තත්කාර්ය අතුරු අග්‍රිමයක් රු.100,000 ක උපරිමයක් දක්වා පමණක් ලබා දිය හැකි අතර මෙම මූල්‍ය සීමාවන් ඉක්මවීමට අවශ්‍යවන අවස්ථාවලදී ගණන්දීමේ නිලධාරියා විසින් එම අවශ්‍යතාවය තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කරමින්, අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශයද සහිතව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. එහෙත් අත්තිකාරම් සීමා සංශෝධනය කර ගැනීමකින් තොරව සැලසිනෝ ආයතනය විසින් මෙම සීමාව ඉක්මවා අවස්ථා 13 දී රු.197,500 ක සිට රු.876,000 ක් දක්වා පරාසයක එකතුව රු.5,468,508 ක්වූ අත්තිකාරම් ලබා දී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.25,628,992 ක ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අලාභය රු.28,537,463 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,908,471 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ සෘජු වියදම, පෙර වර්ෂයට සාපේක්ෂව රු.112,389,843 කින් වැඩිවී තිබුණද, ආදායම රු.130,075,022 කින් වැඩි වී තිබීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙකක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂයේ රු. 686,947 ක් වූ ශුද්ධ අලාභය 2016 වර්ෂය වන විට රු. 25,628,992 ක් දක්වා වර්ධනය වී තිබුණි. තවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2014 වර්ෂයේ රු. 26,070,098 ක් වූ ආයතනයේ දායකත්වය 2016 වර්ෂය අවසානය වන විට රු.16,065,700 ක් දක්වා අඩුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ජනාධිපතිතුමාගේ පාර්ලිමේන්තු දිවියට දින දසදහසක් පිරීම නිමිත්තෙන් ජනාධිපති විශේෂ මාධ්‍ය ඒකකය විසින් "දියවන්නාවේ දින දසදහසක් " ව්‍යාපෘතිය සැලසුම් කර තිබූ අතර එහි වූ වැඩ සටහනක් ලෙස 2016 ඔක්තෝබර් 02 වන දින කැළණි රජමහා විහාරයේ පැවැත්වූ බෝධිපූජා පිංකම සැලසිනේ ආයතනය විසින් සංවිධානය කර තිබුණි. මේ සඳහා ආයතනය වෙත අනුග්‍රාහකයන්ගෙන් රු.15,250,000 ක් ලැබී තිබුණු අතර අදාළ වැඩ සටහන සඳහා රු.11,084,197 ක් වැය කර තිබුණි. මෙම වියදම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මෙම වැඩ සටහන සඳහා තාවකාලික පදනම මත සේවකයන් දසදෙනෙකු බඳවාගෙන ඒ වෙනුවෙන් එකතුව රු.430,000 ක් ගෙවීම් කර තිබුණි. බඳවාගැනීම් සඳහා ලබාදී තිබූ පත්වීම් ලිපිවලට අනුව, 2016 ජුලි 01 දින සිට සේවයට වාර්තා කළයුතු බව දන්වා තිබුණද සේවය අවසන් කරන දිනය, නියමිත රාජකාරිය, ලබාදීමට යෝජිත දීමනාව කොපමණ කාලයක් සඳහාද යන්න නිශ්චිතව සඳහන් කර නොතිබුණි. එසේම අදාළ ගෙවීම් සඳහා සේවය කළ දින ගණන හෝ කාලසීමාව තහවුරු කිරීම සඳහා දෛනික පැමිණීමේ ලේඛනයක් හා කළ වැඩ ලේඛනයක් නඩත්තු කර නොතිබුණු බැවින් අදාළ ගෙවීම් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) මෙම වැඩසටහන සඳහා අලෙවි උපදේශක හා අලෙවිකරණ සහායක යන තනතුරු සඳහා පුද්ගලයන් දෙදෙනෙකු බඳවාගෙන ඔවුන් සඳහා පිළිවෙලින් රු.150,000 ක් හා රු.5,000 ක් බැගින් ගෙවීම්කර තිබුණි. වැඩසටහන සඳහා මෙම තනතුරු ඇති කිරීමේ අවශ්‍යතාව විගණනය වෙත පැහැදිලි කර නොතිබුණි.

(ඇ) 2016 ජුනි 27 දිනැති පත්වීම් ලිපිය ප්‍රකාරව, 2016 ජුලි 01 දින සිට ක්‍රියාත්මකවන පරිදි ඉසව් සංවිධායකවරයකු ලෙස පුද්ගලයකු බඳවාගෙන තිබූ අතර සේවය කරනු ලබන කාලසීමාව නිශ්චිතව තීරණය කිරීමකින් තොරව 2016 අගෝස්තු මාසයේදී රු.30,000 ක දීමනාවක් ගෙවා තිබුණි. තවද දියවන්නාවේ දින දස දහසක් වැඩ සටහන නිර්මාණය කිරීම වෙනුවෙන් 2017 අප්‍රේල් 26 දිනැති ලිපිය මගින් ගෙවීමට පොරොන්දු වූ ලෙස දක්වා රු.100,000 ක මුදලක් ඉල්ලුම් කර තිබුණි. එහෙත් අදාළ වැඩ සටහන අමුණා ඇති බව දක්වා තිබුණද එවැනි වැඩ සටහනක් හෝ එකී මුදල් ගෙවීමට එකඟ වූ ලිඛිත ගිවිසුමක් හෝ නොමැතිව ඉසව් කළමණාකරුගේ නිර්දේශය මත ඒ සඳහා රු.50,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) බෝධිපූජා පිංකම සඳහා විදුලි ආලෝකය සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,195,000 ක් ගෙවීම් කර තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආයතන දෙකකින් අත් මිල ගණන් ලබාගෙන තිබූ අතර එක් ආයතනයක් විසින් චෛත්‍ය ආලෝකමත් කිරීමේ කාර්යය හැර අනෙකුත් කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් රු. 545,000 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණු අතර අනෙක් ආයතනය සම්පූර්ණ කාර්යයම ඉටු කිරීම වෙනුවෙන් රු.650,000 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව සම්පූර්ණ කාර්යය සඳහා මිල ගණන් ඉදිරිපත් කල ආයතනයෙන් සම්පූර්ණ කාර්යයම ඉටු කර ගැනීමට හැකියාව තිබියදී එක් ආයතනයකින් චෛත්‍ය ආලෝකමත් කිරීමේ කාර්යය පමණක් හා අනෙක් ආයතනයෙන් අනෙකුත් කාර්යයන් ඉටුකර ගැනීමට තීරණය කර තිබීම හේතුවෙන් රු.45,000 ක අමතර පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

(ii) තවද චෛත්‍ය ආලෝකමත් කිරීමේ කාර්යය හැර අනෙකුත් කාර්යයන් ඉටුකර තිබූ චින්තක ඉලෙක්ට්‍රිකල් ආයතනය වෙත රු.545,000 ක් හා චෛත්‍ය ආලෝකමත් කිරීමේ කාර්යය පමණක් ඉටුකල නිව්සිටි ඉලෙක්ට්‍රිකල්ස් ආයතනය වෙත ඒ සඳහා ඇස්තමේන්තු මුදල වූ රු.150,000 ක් පමණක් ගෙවීම වෙනුවට මුළු ඇස්තමේන්තු මුදල වූ රු.650,000 ක් ගෙවීම් කිරීම හේතුවෙන් රු.500,000 ක වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 ඡේදය ප්‍රකාරව රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා සඳහා ලිඛිත ගිවිසුමකට එළඹිය යුතු වුවත් ඉහත කාර්යය ඉටුකරගැනීමේදී ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි.

(iv) තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ඡේදය ප්‍රකාර පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් මත අදාළ වටිනාකමින් සියයට 20 ක වටිනාකමක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ගෙවිය හැකි වුවත් කිසිදු සුරක්ෂණයක් ලබානොගෙන ඇස්තමේන්තු මුදලින් සියයට 50 ක් වූ රු.272,500 ක අත්තිකාරම් මුදලක් චින්තක ඉලෙක්ට්‍රිකල්ස් ආයතනය වෙත ගෙවා තිබුණි.

(ඉ) අවශ්‍යතාවය තක්සේරු කිරීමකින් තොරව දැන්වීම් පත්‍රිකා 30,000 ක් මුද්‍රණය සඳහා රු.317,016 ක් ගෙවා තිබූ අතර අදාළ දැන්වීම් ප්‍රමාණය නිවැරදිව ලද බවට හෝ භාරගත් බවට සාක්ෂියක් හෝ දැන්වීම්වල ආදර්ශයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මුද්‍රණය කළ දැන්වීම් ප්‍රදර්ශනය කල බවට තහවුරු කර ගැනීමකින් තොරව පුද්ගලයන් 4 දෙනෙකු වෙත ඒ වෙනුවෙන් රු.292,000 ක මුදල් ගෙවා තිබුණි.

(ඊ) වැඩ සටහනට අදාළව නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා පෞද්ගලික ආයතනයකින් එකක් රු.650 බැගින් ආයතනික ටී ෂර්ට් 75 ක් මිල දී ගෙන රු.48,750 ක මුදලක් එම ආයතනයට ගෙවා තිබුණද ටී ෂර්ට් තොගය නිවැරදිව ලද බවට හෝ බාරගත් බවට සැලසිනේ ආයතනයේ නිලධාරියකු විසින් සහතික කොට නොතිබුණි.

(උ) විදුලිජනක යන්ත්‍රයක් සැපයීම වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබූ 2016 අගෝස්තු 01 දිනැති අංක ඩබ්ලිව්ජ්එස්/පීපී/අයිසීඑන්/01 දරන ඇස්තමේන්තුව අනුව මණ්ඩලය වෙත රු.117,478 ක මුදලක් ගෙවා තිබුණි. මෙම විදුලිජනක යන්ත්‍රය සඳහා ගෙවීම දියවන්නාවේ දින දසදහසක් වැඩ සටහනේ වියදම් වල ඇතුළත් කර තිබුණද, මෙම සේවාව අදාළ වැඩ සටහන සඳහා ලබාගත් බවට වගකිව යුතු නිලධාරියකු විසින් සනාථ කර නොතිබුණි.

(ඌ) පැරබොලික් හට් සවිකිරීම් සඳහා ඉසව් කළමනාකරු විසින් 2016 ජූලි 29 දින ලබාගත් රු.500,000 ක අත්තිකාරම් මුදලක් 2017 මැයි 09 දින පියවා තිබුණි. අත්තිකාරම් පියවීමේදී මෙම මුදල කැළණි විහාරයට ස්වාභාවික මල් සැරසිලි හා රතුරෝස මල් 5000 ලබාදීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයට ගෙවූ බව දක්වා එම ආයතනයේ ලිපි ශීර්ෂයක් අමුණා තිබුණි. 2017 සැප්තැම්බර් 18 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අදාළ පෞද්ගලික ආයතනය ස්වාභාවික මල් සැපයීම හෝ සැරසිලි නොකරන බවත්, කැළණිය විහාරයේ 2016 වර්ෂයේදී ඉහත පිංකමට අදාළ සැපයුම් කර නොතිබූ බවත් නිරීක්ෂණය විය. තවද එම ආයතනයට ගෙවූ රු.500,000 ක මුදල සඳහා සකස් කර තිබූ පොදු 35 වවුචරයේ ගෙවීම්ලාභියාගේ නම සඳහන් කර නොතිබුණි.

(එ) ආයතනයට ලැබෙන සියලුම භාණ්ඩ මුදල් රෙගුලාසි 751 (1) ඡේදය ප්‍රකාරව වහාම බඩු ලේඛන පොතෙහි සටහන් කළයුතු වුවත් මෙම වැඩ සටහන සඳහා ලබාගන්නා ලද අයිතම 4 කට අදාළ වටිනාකම රු.1,455,381 ක් වූ භාණ්ඩ ලේඛන ගත කොට නොතිබුණි.

**4.2 අවිධිමත් ගනුදෙනු**

සැලසිනේ රූපවාහිනි ආයතනය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල ජාතික චිත්‍රපට සංස්ථාවට අයත් වන අතර එම ගොඩනැගිල්ල 2013 වර්ෂයේ සිට කුලී පදනම මත වර්ෂ 5 ක කාලයක් සඳහා ලබාගෙන තිබුණි. බදු ගිවිසුමේ 7 ඡේදය ප්‍රකාර බදු දීමනාකරුගේ ලිඛිත අනුමැතියකින් තොරව කිසිදු අලුත්වැඩියාවක් හෝ එකතු කිරීමක් නොකළ යුතු බව දක්වා තිබියදී ගොඩනැගිලි හිමිකරුගේ අනුමැතියකින් තොරව 2014 වර්ෂයේදී ආයතනය විසින් රු.9,293,750 ක අලුත්වැඩියාවන් සිදු කර එම වියදම ගොඩනැගිලි කුලියට හිලවු කිරීමට ඉල්ලීම් කර තිබුණි. එහෙත් ජාතික චිත්‍රපට සංස්ථාව විසින් එයට ඉඩදී නොතිබුණි. ඒ හේතුවෙන් එකී වියදම ගොඩනැගිලි වියදම් ලෙස ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර වර්ෂ 5 කින් කපා හැරීමට තීරණය කර සමාලෝචිත වර්ෂයේ ලාභයට එරෙහිව රු.1,842,062 ක් කපාහැර තිබුණි.

**4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්**

දුර්වල මූල්‍ය කළමනාකරණය, අභ්‍යන්තර පාලනයේ දුර්වලතාවය හා අභ්‍යන්තර විගණනය ක්‍රමානුකූලව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ආයතනයේ නිලධාරීන් විසින් 2014 වර්ෂයේ දී සිදුකර තිබූ රු.11,988,000 ක මූල්‍ය වංචාව සම්බන්ධයෙන් ආයතනය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ XLVII පරිච්ඡේදයේ 5.3 වගන්තිය ප්‍රකාරව වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව ක්‍රියාකිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

2016 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත ස්ථිර හා තාවකාලික කාර්ය මණ්ඩලය පිළිවෙලින් 31 දෙනෙකු හා 39 දෙනෙකු විය. තත්‍ය කාර්ය මණ්ඩලය 69 දෙනෙකු වූ අතර එය ස්ථිර සේවකයන් 15 දෙනෙකු හා තාවකාලික සේවකයන් 54 දෙනෙකුගෙන් සමන්විත විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත තනතුරු සඳහා පුරප්පාඩු තිබිය දී අනුමත නොවූ තනතුරු නාම 32 ක් සඳහා කාර්ය මණ්ඩලය 33 දෙනෙකු බඳවා ගැනීම් සිදුකර තිබුණි. මෙම නිලධාරීන් වර්ෂ 2 සිට වර්ෂ 29 දක්වා කාල පරාසයක් තුළ සේවයට බඳවාගෙන තිබූ අතර එයින් 8 දෙනෙකුගේ සේවය ස්ථිර කර තිබුණි. මෙම තනතුරු නාම ආයතනයේ අවශ්‍යතාවය අනුව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව හා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව මගින් අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අනුමත ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් තනතුරු නාම 10 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 16 දෙනෙකු බඳවා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එයින් සහකාර කැමරා ශිල්පි තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබූ නිලධාරියෙක් අනුමැතිය රහිතව සේවයේ ස්ථිර කර තිබුණි.

(ඇ) අනුමත ස්ථිර හා කොන්ත්‍රාත් තනතුරු නාම 17 කට අයත් සේවක සංඛ්‍යාව 41 දෙනෙකු වූ අතර ඉන් 33 දෙනෙකු 2013 හා 2014 වර්ෂවල සිට පුරප්පාඩුව පැවති අතර එම තනතුරු සඳහා කාර්ය මණ්ඩලය අලුතින් බඳවා ගැනීමට හෝ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇති නිලධාරීන්, බඳවා ගැනීමේ පරිපාටි සකස්කර ඒවාට අනුකූලව ස්ථිර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඉ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2014 ඔක්තෝබර් 15 සහ 2016 ජුනි 02 දින වලදී සැලසිනේ ආයතනයට යොමු කර ඇති අංක ඩීඑම්එස් 1595 දරන ලිපි මගින් බඳවා ගැනීමේ පරිපාටි සකස් කර අනුමත කර ගන්නා ලෙස උපදෙස් දී තිබුණ ද විගණන දිනය වූ 2017 ජූලි මාසය වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ) අනුමත හා අනුමත නොවූ කොන්ත්‍රාත් තනතුරු සඳහා බඳවාගෙන තිබූ කාර්ය මණ්ඩලයේ 39 දෙනෙකුගේ කොන්ත්‍රාත් සේවා කාලය 2017 සැප්තැම්බර් 30 දින මාස 01 සිට අවුරුදු 4 දක්වා කාලයක් ඉක්ම ගොස් තිබුණ ද සේවා කාලය දීර්ඝ කිරීම් හෝ අහෝසි කිරීම් සිදු නොකර අඛණ්ඩව ඔවුන් සේවයේ යොදවාගෙන තිබුණි. එකී කාලයට අදාලව ඔවුන් වෙත එවා තිබූ වැටුප් හා දීමනා වල එකතුව රු.3,307,313 ක් විය.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණකාධිපති වෙත හා එහි පිටපත් අදාල අමාත්‍යාංශයට, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවද, සැලසිනේ රූපවාහිනී ආයතනය විසින් 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ දින 180 ක ප්‍රමාදයෙන් පසුව 2017 සැප්තැම්බර් 09 දිනදීය.

13

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

**5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 6.5.3 ඡේදය ප්‍රකාරව වාර්ෂික වාර්තා ගිණුම් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතු වුවද, 2003 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගනුදෙනුවල විස්තර ලබා ගත හැකි පරිදි ලෙජර ගිණුම් හා අදාළ සම්බන්ධිත තොරතුරු ඉදිරිපත් නොකිරීම. |
| (ආ) | අභ්‍යන්තර විගණනය | සුදුසු කාර්ය මණ්ඩලය අනුයුක්ත කොට අභ්‍යන්තර පාලනයේ දුර්වලතා හා සිදුවිය යුතු වෙනස්කම් හඳුනාගත හැකි පරිදි අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් නොකිරීම. |
| (ඇ) | ණයගැති සහ ණය හිමි පාලනය | නිවැරදි තොරතුරු නියමිත දිනට අවශ්‍ය ආකාරයට ලබා ගත හැකි පරිදි වාර්තා තබා නොගැනීම. |

එච්.එම්. ගාමිණි විජේසිංහ
විගණකාධිපති

# 2016 වර්ෂයේ විගණකාධිපතිතුමාගේ වාර්තාව සඳහා පිළිතුරු

**සැලසිනෙ රූපාහිනී ආයතනයේ 2016 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව සඳහා පැහැදිලි කිරීම්**

**1.4) ආයතනය පිහිටුවීම**

මෙම ආයතනය සඳහා නීතියම ප්‍රතිපාදන ඇති කිරීම සඳහා සෑහෙන පරිශ්‍රමයක් දරන අතර, ජනමාධ්‍ය හා මුදල් අමාත්‍යාංශය යටතට පත්වීමෙන් අනතුරුව රජයට අයත් සීමිත පොදු සමාගමක් ලෙස පත් කිරීමට කැබිනට් පත්‍රිකාවක් 2014 වර්ෂයේ ඉදිරිපත් කර ඒ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතියද ලබාගෙන මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා පවත්වමින් සිටින අතර, මෙම තත්වයට පිළියමක් ඉතා නුදුරේම ලබා ගැනීමට ආයතනය අපේක්ෂා කරනු ලැබේ.

**2.2) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1) ගිණුම්කරණ ප්‍රමිති**

වැඩිපුර ක්ෂය වීමක් ලෙස කපාහැර ඇති රු. 511,269/- ක මුදල පෙර වර්ෂයේ ඉදිරිය ගෙනා ලාභයට ගලපා නිවැරදි කරනු ලැබේ.

**2.2.2) ගිණුම්කරණ අඩුපාඩු**

(අ) 2013 මැයි මස 2 දිනට මිලට ගත් KV 9374 දරන වාහනයේ වටිනාකම රු.1,935,000.00 ක ලෙස වාහන උපලේඛනයේ වැරදීමකින් දක්වා ඇති අතර, එය වැට් බදු සමග මිල වන අතර, එහි බදු රහිත මිල රු. 1,613,750.00 ක් වේ. එය නිවැරදිව අවසන් ගිණුම්වල දක්වා ඇත.

(ආ) ජාතික රූපවාහිනී සංස්ථාව වෙත මෙම ආයතනය විසින් නිරවුල් කලයුතු රු. 598,230 ක ණය ශේෂය රූපවාහිනී සංස්ථාවේ 2016 අවසන් ගිණුම්වල දැක්වෙන ශේෂයන් අතර යම් වෙනසක් ඇති බව ඔබ විසින් කරන ලද පෙන්වා දීම පිළිබඳව නොපමාව පරීක්ෂා කර බලා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) ආයතනයේ නිලධාරියෙකු විසින් 2014 වසරේදී සිදු කල රු. 11,988,000 ක මූල්‍ය වංචාව 2016 වසරේ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 20.2 යටතේ පෙන්වා දී ඇති බව සඳහන් කරමි.ශේෂ පත්‍රයේ මෙය ලැබිය යුතු මුදලක් බැවින්, මූල්‍ය වාර්තාවේ ජංගම වත්කමක් ලෙස ඇතුළත් කර ඇත.

**2.2.3) නොසැසඳුණු ගිණුම්**

(අ) මෙයට අදාළව පැහැදිලි කිරීම් සඳහා වාහන උපලේඛනයේ වූ වරද නිවැරදි කර ඇත.

(ආ) අවසන් ගිණුම් අනුව උපචිත වියදම් ලෙස රු. 26,251,713 ක් සඳහන් කර ඇත. එයට අමතරව විගණන ගාස්තු සඳහා ගෙවිය යුතු මුදල් යටතේ රු. 772,500 ක මුදලක් පෙන්වනු ලැබේ. විගණන ගාස්තු සඳහා පෙර වර්ෂයට ගෙවිය යුතු මුදල රු. 70,500 කි. ඒ අනුව අතිරේකව දැරිය යුතු මුදල රු. 102,500 කි. එම මුදලද ඇතුළත්ව විගණන ගාස්තු රු. 172,500 ක් ලෙස දක්වා ඇති බව සඳහන් කරමි.

(ඇ) ඔබ විසින් පෙන්වා දී ඇති ණය ගැතියන් ගේ අවසන් ගිණුමේ දැක්වෙන අගය හා ණය ගැති ලේඛනයේ දැක්වෙන අගයන් අතර රු. 1,291,077.25 ක වෙනසකට හේතු වන්නේ අදාළ ණයගැතියන් වෙතින් අප වෙත ලැබිය යුතු මුදලක් ඇති විට එය ණයගැති ලේඛනයෙන් අඩුකර දැක්වීම මගිනි. එම අඩු කිරීම් විස්තර ඔබ වෙත එවන ලද උපලේඛනයේ පෙන්වා දී ඇති බව සඳහන් කරමි.

(ඈ) එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට ගෙවිය යුතු ශේෂය හා එම ආයතනයේ ගිණුම් අනුව විගණනයේදී තහවුරු කර ගන්නා ලද ශේෂය අතර රු. 6,584,703.84 ක වෙනසක් ඇති වීමට හේතුව වන්නේ 2013 වසරේ පැවැත් වූ (CHOGAM) උත්සවයට අදාළව දැන්වීම්පල කිරීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යංශයෙන් මුදල් නොලැබීම හේතු කොටගෙනය. ඒ වෙනුවෙන් සැලසිනෙ රූපවාහිනී ආයතනයෙන් ලැබිය යුතු මුදල් ලේක්හවුස් ආයතනය කපා හරින ලද බවක් මෙතෙක් වාර්තා කර නොමැති බැවින්, තව දුරටත් ගෙවිය යුතු මුදලක් ලෙස පෙන්නුම් කරනු ලැබේ.

### 2.2.4 විගණනය සඳහා සාකෂි නොවීම

(අ) ස්ථාවර වත්කම් ලේඛනය ඔබ වෙත එවීමට කටයුතු කරමි.

(ආ ඔබ විසින් සඳහන් කරන ලද රු. 6,611,743.11 ක වටිනාකම මෙම ආයතනයේ ණයගැති ශේෂ කපා හැරීමට අදාළව ජනමාධ්‍ය අමාත්‍යංශය හරහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට යවන ලද ලිපියට අදාළ වූවකි.

(ඇ) මෙයට අදාළ ශේෂ සනාථ කිරීම් අදාළ ගිණුම් වර්ෂයේ දී විගණනයට ඉදිරිපත කර ඇත.

(ඈ) ඔබ විසින් පෙන්වා දී ඇති සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙන් අයකර ගත යුතු මුදල් පිළිබඳව සොයාබලා තොරතුරු නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ණයගැතියන්ගෙන් සනාථ ලබා ගැනිමේ දී සියළුම ණය ගැතියන්ට ශේෂ සනාථකර එවන ලෙස දැන්වීම් දෙනු ලැබේ.එම ලිපි සම්බන්ධයෙන් පිළිතුරු ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලබා ගැනීමට අවශ්‍ය සෑම පියවරක්ම ගන්නා අතර, ආයතනය වෙත යවන ලද ලිපි සම්බන්ධයෙන් පිළිතුරු එවන ලෙස දැනුම් දීමටද කටයුතු කරනු ලැබේ. මෙම ආයතන ප්‍රධානියාගේ අවධානයට නැවත ලක්වෙන පරිදි අතිරේක ලිපියක් යැවීමටද ඉදිරියේ දී, කටයුතු කරනු ලැබේ. මෙමගින් වැඩි තහවුරු කිරීම් ප්‍රමාණයක් ලබා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

(ආ) ඔබ විසින් සඳහන් කරන ලද රු. 6,611,743.11 ක වටිනාකම මෙම ආයතනයේ ණයගැති ශේෂ කපා හැරීමට අදාළව ජනමාධ්‍ය අමාත්‍යංශය හරහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට යවන ලද ලිපියට අදාළ වූවකි.

(ඇ) ජාතික රූපවාහිනී සංස්ථාව වෙත මෙම ආයතනය විසින් නිරවුල් කටයුතු ණය ශේෂය හා රූපවාහිනී සංස්ථාවේ 2016 අවසන් ගිණුම් වල දැක්වෙන ශේෂයන් අතරයම් වෙනසක් අතිබව ඔබ විසින් කරන ලද පෙන්වා දීම පිළිබදව නොපමාව පරක්ෂා කර බලා අවශ්‍ය තොරතුරු ලබා දීමට කටයුතු කරමි.

(ඈ) රඳවා ගැනීමේ බදු වලට අදාළ උපලේඛණය හා ජාතිය ගොඩනැගීමේ බදු වලට අදාළ උපලේඛණ ද එවීමට කටයුතු කරමි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල වීම

අ) 1) මුරෙ 178(3) (ආ) ජේදය අනුව ගෙවීම් වවුචර් සමග අදාළ ගෙවීම සනාථ කිරීමට හැකිවන පරිදි ඔබ විසින් පෙන්වා දුන් ලිපි ලේඛණ හා විස්තර අමුණා නොතිබූ පහත සඳහන් දෑ සම්පූර්ණ කර ඔබ වෙත එවීමට කටයුතු කරමි.

| | | | | |
|---|---|---|---|---|
| 2016.08.15 | - | රිවිර පුවත්පතේ ජනාධිපතිතුමා - අදාළ දැන්වීම් ලිපිගොනුව ඇතුළත් කරන ලදි. මුදල | - රු. 240,592/- | |
| 2016.08.15 | - | උපාලි පුවත්පත මුදල | - රු. 241,536/- | - එම |
| | - | 08/095 - විජය පුවත්පත මුදල | - රු. 618,464.25 | - එම |
| | - | 08/094 - ලේක් හවුස් ආයතනය | - රු. 203,796/- | - එම |
| | - | 08/096 - ලංකා නිවුස් ජේපර්ස් | - රු. 490,620/- | - එම |

2016.12.30 ඔබ විසින් පෙන්වා දුන් රථයේ අංක KV 1374 නිවැරදි නොවන අතර, එය KV 9374 ලෙස නිවැරදි විය යුතුය.

මෙම පිංකමට අදාළව රාජකාරි ඉටුකිරීමේ දී ඒ සඳහා නිරත පුද්ගලයන් වෙත අවශ්‍ය වාහන පහසුකම් දෙන ලෙස නියෝග කර තිබුණි.ආයතනය සතු වාහනයක් මෙම කැළණිය පිංකමට අදාළව රාජකාරි වැඩකටුතු වල නිරත පුද්ගලයන් ගේ අවශ්‍යතා සඳහා යොදා ගෙන ඇත. මේ සඳහා ලිඛිත අනුමැතිය දීම එම අවස්ථාවේ තිබූ රාජකාරි බහුලත්වය නිසා සිදු නොවූ අතර, වාචිකව අදාළ අනුමැතිය ලබා දීම සිදු කර ඇත.

2016.12.30 රු. 2,000 ක ඉන්ධන ගැසීම මෙම පිංකමට අදාළව රාජකාරි ඉටුකිරීමට යාමේ දී දරන ලද වියදමක් වන අතර, එම කුළී රථයේ අංකය එම අවස්ථාවේ සඳහන් කිරීමට එම නිලධාරීන්ට අතපසු වී ඇත.කෙසේ වෙතත් ඉදිරියේදී එවැනි අවස්ථාවල වාහන අංක නිසි පරිදි සටහන් කලයුතු බව අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

මොබිටෙල් ආයතනය
අංක 071 - 8078388 දරණ අංකය සැලසිනෙ හිටපු සභාපති තුසිත ජයවර්ධන මහතාගේ ජංගම දුරකථනය වේ. මෙම පිංකමට අදාලව රාජකාරි කටයුතු ඉටු කිරීමේදී නිතර නිතර මෙම දුරකථනය භාවිතා කිරීමට සිදුවිය. දුරකථන පහසුකම් කැළණිය පුදබිම ප්‍රදේශයෙන් ලබා ගත නොහැකිවූ අතර, වෙනත් දුරබැහැර ස්ථානවලට ඇමතුම් රාශියක් මෙම දුරකථනයෙන් අනුග්‍රාහකයන්, සැපයුම්කරුවන්, ආයතනයේ නිලධාරීන්ට ඇමතුම් ලබා දෙන ලදී. ඒ නිසා එම දුරකථනයේ මාසික දුරකථන සීමාව ඉක්මවා ගිය බැවින්, එම වියදම් පිංකමට අදාළව සිදුකර ඒවා බැවින්, සාධාරණය කර වියදමින් දරා ඇති කොටසක් සභාපතිතුමා වෙත ලබා දීමට අදාළ කමිටුව තීරණය කර ලදි.

2016.12.30 හෝමාගම විවිධ සේවා සමූපකාර සමිතිය - මෙය ද මෙම පිකමට අදාළ රාජකාරී කටයුතු වලට නිරත නිලධාරීන් විසින් දරන ලද වියදමක් වන අතර, කාර්ය බහුලත්වය නිසා වාහන අංකය සටහන් කර ගැනීමට අතපසු වී ඇත. කෙසේ වත් මෙවැනි අවස්ථා වලදී එම තොරතුරු නිසිපරිදි සටහන් කර තබා ගැනීම කලයුතු බවට අදාළ නිලධාරීන් වෙත දැනුම් දෙන ලදී.

2016.12.30 ලලිත් මහතා මෙම ආයතනයේ මුද්‍රණ කටයුතුභාර නිලධාරියා වේ - මොහු ලවා මෙම පිංකමට අදාළ ලිපිලේඛන වල ප්‍රචාරක නිර්මාණ කටයුතු සිදුකර ගැනීමට ඔහුගේ සේවය අවශ්‍ය විය.එමෙන්ම මෙම ආයතනයේ ශ්‍රව්‍ය දෘශ්‍ය අංශයේ ප්‍රධානී ලෙස කටයුතු කල අතුල අන්ද්‍රාදි මහතා ද නිලධාරීන් ගේ හිඟයට පිළියමක් ලෙස මෙම උත්සවයේ ප්‍රචාරණ කටයුතුවල වගකීම පවරන ලදී. මෙම මධ්‍යම රාත්‍රිය ඉක්මවා මේ දෙදෙනාගේ සේවය ලබා ගැනීමේ දී වාහන පහසුකම් හිඟවීම මත ඔවුන් පෞද්ගලික ත්‍රීරෝද රථයකින් නිවෙස් වෙත යැවීම සිදු කරන ලදි.ඒ සඳහා එම අවස්ථාවේ වාචික අනුමැතිය ලබා දී ඇත.

11.) මෙම ලිපියේ සඳහන් වන රු. 1,930,012/- ක නිශ්පාදන අත්තිකාරම් හා රු. 1,370,000/- ක වටිනාකමැති වෙනත් අත්තිකාරම් ලෙස ලබා දී ඇති මුදල් 2017.06.30 වන විට නිරවුල් කර ඇතිබව සඳහන් කරමි. මෙම ආයතනයේ අත්තිකාරම් ලේඛනය මගින් එම නිරවුල් කිරීම සනාථ වේ.

- මුරෙ 371(2) (ඇ) ඡේදය ප්‍රකාර කිසියම් කාර්යන් සඳහා අත්තිකාරම් ලබා දීමේදී මාණ්ඩලික නිලධාරියෙකු වෙත ලබා දිය යුතු බව සඳහන් වේ. එහෙත් මෙම ආයතනයේ එවැනි ගණයේ නිලධාරීන් ලෙස ගත හැකි නිලධාරීන් වන්නේ, සාමාන්‍යාධිකාරී, ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී තනතුරු දරණ අය පමණි. ඉසව් කළමනාකරණ අංශයේ ඉසව් කළමනාකාරිණී හැරෙන්නට වෙනත් වගකිව යුතු මාණ්ඩලික මට්ටමේ නිලධාරීන් නොමැත. එම නිසා අතිගරු ජනාධිපතිතුමා වෙනුවෙන් පවත්වන මෙම උත්සව කටයුතු බාධාවකින් තොරව, සිදුකල යුතු බැවින්, ඊට සම්බන්ධ නිලධාරීන් වෙත අත්තිකාරම් ලබාදීම හැර වෙනත් විකල්පයක් නොතිබූ නිසා එම නිලධාරීන්ට අත්තිකාරම් ලබා දී ඇති බව සඳහන් කරමි.

- 2015 ජුලි 14 දිනැති අංක 3/ 2015 දරණ චක්‍රලේඛය මගින් සංශෝධිත මු.රෙ. 371 (2) (ආ) ඡේදය පරිදි අත්තිකාරම් නිකුත් කල හැක්කේ රු. 100,000.00 කි. එහෙත් සැලසිනෙ ආයතනය විසින් ආයතනයට පැවරෙන කාර්‍යයන් හි නිරතවීමේදී මෙම සීමාව ඉක්මවා අත්තිකාරම් ලබා දීමට සිදුව ඇත. විශේෂයෙන් ඉසව් රාජකාරී ඉතා සීමිත දින ගණනක් තුල ඉටු කල යුතු බැවින් ඒවා නියමිත දිනට ඉටු කිරීම අදාල පාර්ශවය වෙත අත්තිකාරම් ලබා දීමට සිදු වේ. මෙම තත්වයට පිලියමක් ලෙස ඉහත චක්‍රලේඛය පරිදි ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය සහිතව මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට ලිපියක් පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 25,628,992 ක ශුද්ධ අලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දී ශුද්ධ අලාභය රු. 25,537,463 ක් විය. ඒ අනුව 2016 වර්ෂයේ මූල්‍ය අලාභය පෙර වර්ෂය හා සැසඳීමේ දී රු. 2,908,471 කින් අඩුකර ගත හැකිවිය.මෙම තත්වයට හේතු වූයේ 2016 අලෙවි පරිමාව පසුගිය වසරට වඩා රු.මි.130 කින් වැඩි වීමත්, දළ ලාභය පසුගිය වසරට වඩා රු. මි. 17.8 කින් වැඩි වීමත්, ආයතනයේ අලෙවි කටයුතු වර්ධනය කිරීම සඳහා ගත් සැලසුම් මැනවින් ක්‍රියාතමක වීම තුළින්, යහපත් ප්‍රවණතාවයක් පෙර වසර සමග සැසඳීමේ දී දක්නට ලැබීමය. ආයතනයේ පරිපාලන වියදම් අඩු කර ගැනීම තුලින් ලාභය වැඩිකර ගැනීමට වැඩි අවධානයක් ඉදිරියේදී යොමු කර ඇත .

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 මත භේදයට තුඩුදෙන ගණුදෙනු

අතිගරු ජනාධිපතිතුමාගේ පාර්ලිමේන්තු දිවියට දසවසරක් පිරීම නිමිත්තෙන් සංවිධානය කළ "දියවන්නාවේ දින දස දහසක්" මැයෙන් සකස් කල වැඩසටහන එවකට ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේ ලේකම්ව සිටි නීතිඥ නිමල් බෝපගේ මහතාගේ සංකල්පයකට අනුව සැලසිනෙ රූපවාහිනී ආයතනයේ එවකට සභාපතිව සිටි තුසිත ජයවර්ධන මහතා විසින් නිර්මාණය කොට සැලසුම් කරන ලද ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය අතිගරු ජනාධිපතිතුමාගේ පූර්ණ අනුමැතිය හා ආශිර්වාදය යටතේ සංවිධානය කර ඇත. අදාල වැඩසටහන මුළු දිවයින පුරා පිහිටි පූජනීය ස්ථානවල (බෞද්ධ/ කතෝලික/ හින්දු/ මුස්ලිම්) සිදු කිරීමට සැලසුම් කර ඇත. මේ සඳහා ආයතනය තුලින් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයන් ලබා ගැනීමට අසීරු වීම නිසා එවැනි වගකීම් සහිත කටයුතු ඉටු කිරීමට මනා හැකියාවක් ඇති පුද්ගලයන් තාවකාලිකව බඳවා ගැනීමට පාලන අධිකාරිය තිරණය කර ඇත. අතිගරු ජනාධිපතිතුමාගේ කාර්ය බහුලත්වය මත මෙම උත්සවය පවත්වන දිනය නිශ්චිත ලෙස ප්‍රකාශ කිරීමට අසීරු වු බැවින්, ඒ හේතුකොට ගෙන අදාල සේවකයන්ට 2016 ජූලි 01 දින නිකුත් කල පත්වීම් ලිපියේ පත්වීම අවසන් වන දිනය සඳහන් කිරීම සිදු නොකිරීමට පාලන අධිකාරිය ක්‍රියා කර ඇත.

අ) මෙවැනි දිවයින පුරා සිදුකරන ආගමික උත්සවයකදී අවස්ථානුකූලව එම තනතුරට අදාලව රාජකාරී පැවැරීම සිදුවීම ඉසව් කළමනාකරණයේ ස්වභාවයයි. ඉහත සඳහන් කල පරිදි දිවයින පුරා, දුර බැහැර ප්‍රදේශ වල සංවිධාන කටයුතු අදාල නිලධාරීන්ට පැවරී තිබූ මොහොතක වැඩ ලේඛණ, පැවැරීමේ ලේඛන, පැමිණීම හා පිටවීමේ ලේඛන නඩත්තු කිරීම ප්‍රායෝගික වශයෙන් අපහසු බැවින්, සම්බන්ධීකරණ ජාලය තුලින් සියළු තොරතුරු ලබා ගැනීමට හා අධීක්ෂණ කටයුතු කිරීමට පාලන අධිකාරිය කටයුතු යොදා ඇත.

ආ) මෙම බෞද්ධ ආගමික වැඩසටහනක් වුවද, ආරම්භයේදී දිවයිනේ විවිධ ප්‍රදේශ වල ඉසව් රාශියකින් සමන්විත වැඩසටහන් ලෙස සංවිධානය කර ඇත. ඒ වෙනුවෙන් වන වියදම පියවා ගැනීමට රාජ්‍ය අරමුදල් යොදා නොගත යුතු බව අතිගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කර ඇත. ඒ නිසා අවශ්‍ය මුදල් පෞද්ගලික ප්‍රජාවගේ අනුග්‍රහයෙන් ලබා ගැනීමට යෝජනා වී ඇත. මේ සඳහා ව්‍යාපාරික ප්‍රජාව සමග සම්බන්ධතා ඇති අයෙක් පත් කර ගැනීමට අත්‍යවශ්‍ය වී ඇති අතර, ඒ අනුව ඔබ විසින් විමසා ඇති පත්වීම් සිදු කර ඇත. ඔවුන් ඒ සම්බන්ධයෙන් ගෙවීමට ඇති මුදල් ඔවුන් කාර්‍යභාරය පිළිබඳව සෑහීමකටපත්ව ගෙවීම් සිදු කර ඇත.

ඇ) ඉසව් සංවිධායක ලෙස කටයුතු කල සමන් රත්න තිලක මහතා විසින් ඔහු ඉටුකල කාර්ය භාරයේ හා පැවරී තිබූ වගකීම් ඉටුකිරීම සැලකිල්ලට ගෙන ඔහු වෙත රු. 30,000/- ක මුදලක් ගෙවීමට කටයුතු සූදානම් කර තිබූ අතර, පසුව එම මුදල ඉටුකල වැඩ ප්‍රමාණය යලි සලකා බැලීමෙන් අනතුරුව රු. 30,000/- ක චෙක්පත අවලංගු කර රු. 50,000/- ක් ගෙවීමක් ඉසව් කලමනාකාරිණි මිය විසින් ලබා දුන් නිර්දේශය පදනම් කර ගෙන නිසි අනුමැතිය සහිතව පෙර පැවති පාලන අධිකාරිය විසින් ගෙවීමට කටයුතු කර ඇත.

ඈ) කැලණිය රජමහා විහාරයේ පැවැත් වූ පිංකම වෙනුවෙන් විදුලි ආලෝකය සැපයීම සඳහා ආයතන 02 කින් මිල ගණන් ඉදිරිපත් වී ඇත.

| | | |
|---|---|---|
| චින්තක ඉලෙක්ට්‍රිකල්ස් | - | රු. 545,000/- |
| නිව්සිටි ඉලෙක්ට්‍රිකල්ස් | - | රු. 650,000/- |
| | | රු. 1,195,000/- |

i) මෙම කාර්යය වෙන වෙන ආයතන වෙත ලබා දීමට සිදුවී ඇත්තේ එක් ආයතනයකට යම් නිශ්චිත කාර්යයක් පමණක් පැවරීමට සිදු වීම නිසාය.

ii) මේ සම්බන්ධයෙන් වංචා විමර්ශන අංශයේ පැමිණිල්ලක් සිදු කර ඇත. පරීක්ෂණ කටයුතු සිදු වෙමින් පවතී.

iii) මෙම අවස්ථාවේ තිබූ කාර්ය බහුලත්වය නිසා අදාළ පාර්ශ්වය සමග ලිඛිතව ගිවිසුමක් ඇති කර ගැනීමට නොහැකි වී ඇත. ඉදරියේ දී ප්‍රසම්පාදන සංග්‍රහය පරිදි ලිඛිත ගිවිසුම් වලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

iv) අදාළ සැපයුම් ආයතනය අත්තිකාරම් ලබා ගැනීමේ දී සුරක්ෂණයක් ලබා දීම ප්‍රතික්ෂේප කිරීමත් මෙම කාර්යය ඉතා ඉක්මනින් කිරීමට අවශ්‍ය වීමත් මෙයට හේතු විය.

ඉ) අදාළ දැන්වීම් වල ආදර්ශ ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. මෙම කටයුතු ඉතා හිදිසියේ ඉටු කරවා ගත යුතුවූ අතර, ඉසව් කළමනාකාරණිය විසින් ඒවා නිසි පරිදි ලබා ගෙන මුදල් ගෙවීමට කටයුතු කර ඇත.

ඊ) එම ටී ෂර්ට් 75 මිලදී ගැනීම සිදු කල කළමනාකරු විසින් ඒවා ලැබුණු බවට සහතික කළ අතර, එහි පිටපතක් ඔබ වෙත එවීමට කටයුතු කර ඇත.

උ) අදාළ විදුලි ජනක යන්ත්‍රයක් වෙනුවෙන් ලංකා විදුලි බල මණ්ඩලය වෙත කල ගෙවීම එම යන්ත්‍රය පරිහරණයට යොද වීම වෙනුවෙන් වන අතර, අදාළ ඉසව් කළමනාකාරිනිය විසින් ඒ බව දැනුම් දෙන ලදි. ගෙවීම සිදු කර ඇත.

ඌ) මේ සම්න්ධයෙන් වංචා විමර්ශන අංශයේ පැමිණිල්ලක් කර ඇති අතර, සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී.

එ) එම භාණ්ඩ අතරින් රු. 22,500/- වටිනාකමැති මුද්‍රණ යන්ත්‍රය ඉන්වෙන්ට්‍රිගත කිරීමට කටයුතු කර අදාළ ලේඛන ඔබ වෙත එවා ඇත. සෙසු අයිතම් වන බැනර්, දැන්වීම් පත්‍රිකා, ටී ෂර්ට් පරිභෝජන ගණයට අයත් වන ඒවා බැවින්, ඒවා තොග පොතට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

### 4.2 අවධිමත් ගණුදෙනු

සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වර්තමාන ගොඩනැගිල්ල සුදුසු තත්වයට පත් කර ගැනීම වෙනුවෙන් එහි හිමිකරු වන රාජ්‍ය චිත්‍රපටි සංස්ථාව සතු වර්තමාන ගොඩනැගිල්ල සුදුසු තත්වයට පත් කර ගැනීමට අදාළ වියදම් දැරීමට එවකට සිටි පාලන අධිකාරිය විසින්, එම ආයතනයේ අනුමැතිය සහිතව කටයුතු කර ඇත. එහිදී දරන ලද ප්‍රාග්ධන වියදම එක් වර්ෂයකට වඩා විහිදී යන නිසා එම වියදම ගොඩනැගිල්ලේ බදු කාල සීමාව ඇතුළත බෙදා හැරීමට කටයුතු කර ඇත.

### 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

ආයතනයේ මූල්‍ය කළමනාකරණයේ පැවැති දුර්වලතා හේතු කොටගන සිදුවූ මූල්‍ය වංචාව පිළිබඳ අභ්‍යන්තර විනය පරීක්ෂණයක් සිදු කර ඇත. අදාළ නිලධාරීන් දැනට ආයතනයේ සේවයෙන් ඉවත් ව ගොස් ඇත.

### 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

අ) අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණයක් අනුව අනියම් ආදේශ කම්කරුවෙක් සේවයේ යොදවා ඇත. හිටපු සභාපතිවරුන් හා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙම සේවකයන් ස්ථිර කිරීමට අවශ්‍ය කටයුතු මේ දක්වා සිදු කොට නොමැති අතර, වත්මන් සභාපති ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අදාළ පටිපාටි නැවත සංශෝධන කර සේවකයන් ස්ථිර කිරීම සඳහා අදාළ නිලධාරීන් වෙත දැනටමත් උපදෙස් ලබා දී ඇත. එක කාර්ය කඩනමින් ඉදිරිපත් කිරීමට බලාපෙරොත්තු වෙමි. එකී බඳවා ගැනීම් කඩිනමින් සකස් කර අනුමත කිරීමෙන් පසුව ඔබ වෙත දැන්වීමට කටයුතු කරනු ඇත.

ආ) එවැනි බඳවා ගැනීමක් සිදු කර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.

ඇ) කාරුණිකව අ, ආ පිලිතුරු බලන්න.

ඉ) DMS 1595 දරණ ලිපියෙන් දන්වා ඇති පරිදි වත්මන් සභාපතිවරයා විසින් බඳවා ගැනීමේ පටිපාටිය නැවත සකස් කිරීමට අවශ්‍ය උපදෙස් නිලධාරීන් වෙත දැනටත් ලබා දීමට කටයුතු යොදා ඇත.

ඊ) කාර්ය මණ්ඩලයේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම ගැන හිටපු සභාපතිවරුන් හා අධක්ෂ මණ්ඩලය ක්‍රියා කොට නොමැති බැවින්, අදාළ අංශභාර කළමනාකරුවන්ගේ නිර්දේශ ලබාගෙන වැටුප් ගෙවීම සිදු කරන ලදි. ඉදිරියේ දී එම කාර්ය මණ්ඩලයේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය උපදෙස් නිලධාරීන් වෙත ලබා දී ඇත.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී ඉදිරියේදී PED/12 හා 2003.06.02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේකයෙ 6.5.1 වගන්තිය පරිදි ගිණුම් වර්ෂය අවසන්වී දින 60ක් ඇතුළත ඉදිරිපත් කිරීමට කටයුතු යොදනු ලැබේ.

### 5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

මේ වන විට ඉදිරිපත් කර නොතිබූ 2014 සහ 2015 වර්ෂ වලට අදාළ ගිණුම් වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යංශය වෙත භාරදීමට කටයුතු යොදා ඇත. 2016 වර්ෂය සඳහා වූ ගිණුම් වාර්තාව විගණකාධිපති ගේ දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තන ලැබූ විගස යැවීමට සූදානම් කරමින් පවතී. ඊට පෙර කාල සීමාවට අදාළ ගිණුම් වාර්තා සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු යොදනු ලැබේ.

## 6. පද්ධති පාලනයන්

(අ) ගිණුම්කරණය

ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි ලෙජර් ගිණුම් වලට අදාළ සම්බන්ධිත තොරතුරු නිසි පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) අභ්‍යන්තර විගණනය

සුදුසු කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කිරීමට හා දැනට අභ්‍යන්තර විගණන අංශයේ පවත්නා අඩුපාඩු දුර්වලතා නැති කිරම ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ.

(ඇ) ණයගැති සහ ණයහිමි පාලනය

නිවැරදි තොරතුරු ඉක්මනින් ලබා ගැනීමට හැකි ලෙස වාර්තා තබා ගැනීමට කලට වෙලාවට ණය ශේෂ පියවීමට අවශ්‍ය කටයුතු යොදනු ලැබේ.

Uma Rajamanthri

උමා රාජමන්ත්‍රී
සභාපතිතුමිය
සැලසිනෙ රූපවාහිනී ආයතනය

SELACINE TELEVISION INSTITUTE

SELACINE TELEVISION INSTITUTE
No. 224, Bauddhaloka Mawatha, Colombo 7, Sri Lanka
Tel. : 011 432 0777, 011 205 8227 Fax : 011 205 8229
E mail : info@selacine.lk
www.selacine.lk